2 වැනි පරිච්ඡේදය



ජාතික නිෂ්පාදිතය හා වියදම

2.1 සමස්ත නිරීක්ෂණ

ශ්‍රී ලංකා ආර්ථිකය 2006 දී මූර්ත වශයෙන් සියයට 7.4 කින් වර්ධනය විය. 2005 වර්ෂයේ වාර්තා කළ සියයට 6 ක ඉහළ වර්ධනයට අනුගතව යමින් ලබාගත් මෙම සිත් ගන්නා සුළු වර්ධනය 1978 න් පසු වාර්තා කළ ඉහළම ආර්ථික වර්ධනය වේ. නිතර උච්චාවචනය වූ ඉහළ මට්ටමක පැවති තෙල් මිල ගණන්, ගංවතුර සහ නායයාම් වැනි ස්වභාවික ආපදා සහ නැවතත් ඇරඹී ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සහිත අභියෝගාත්මක වාතාවරණයක් තුළ සාක්ෂාත් කරගත් මෙම වර්ධනය ප්‍රශංසනීය විය. 2005 දී එක්සත් ජනපද ඩොලර් 1,197 ක් වූ ඒක පුද්ගල ආදායම ද 2006 දී එක්සත් ජනපද ඩොලර් 1,355 දක්වා ඉහළ ගියේය. ආර්ථිකයේ සියලුම අංශවල ධනාත්මක වර්ධන අනුපාත සටහන් කෙරුණු මෙම ප්‍රසාරණය පුළුල් පදනමකින් සිදු විය. සේවා අංශය සියයට 8.3 ක ඉහළම වර්ධන අනුපාතය සාක්ෂාත් කරගත් අතර සමස්ත වර්ධනයට සියයට 63 කින් දායක විය.

විදුලි සංදේශ, භාණ්ඩ මෙහෙයවීම සහ මූල්‍ය සේවාවන් හි හිතකර ප්‍රසාරණය මගින් මෙම වර්ධනය තහවුරු විය. වර්ෂයේ පළමු අර්ධය තුළදී සුනාමියෙන් පසු සංචාරක අංශයේ ක්‍රියාකාරකම් යථාතත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළ නමුත්, දෙවන අර්ධය තුළදී ආරක්ෂක තත්ත්වය හේතුකොට ගෙන එය නැවතත් යටපත් විය. කාර්මික අංශය සියයට 7.2 කින් වර්ධනය වූ අතර (2005 දී සියයට 8.3 කි) සමස්ත වර්ධනයට සියයට 26 කින් දායක විය. මෙම අංශයේ මන්දගාමීත්වයට ප්‍රධාන වශයෙන් ආනයන අමුද්‍රව්‍ය සහ වැටුප් පිරිවැය වැඩිවීමෙන් බලපෑමට ලක්වූ උප අංශ හතරෙහිම (පතල් හා කැණීම්, නිමැවුම් කර්මාන්ත, විදුලිය හා ජලය සහ ඉදිකිරීම්) අඩු වර්ධනය හේතු විය. කෘෂිකාර්මික අංශය සියයට 4.7 කින් වර්ධනය වූ අතර, ආර්ථික වර්ධනයට සියයට 11 කින් දායක විය. සුනාමියෙන් පසු ධීවර උප අංශය යථාතත්ත්වයට පත්වීමේ ධනාත්මක බලපෑම වර්ෂය පුරා පැවැතිණි. හිතකර කාලගුණික තත්ත්වය සහ සහන මිල මත වූ පොහොර මගින් ප්‍රතිලාභ අත්වූ කෘෂිකාර්මික උප අංශයද ආන්තික ලෙස වර්ධනය විය. කෙසේ වුවද, කෘෂිකාර්මික කටයුතු වලට මෙන්ම නිෂ්පාදන ප්‍රවාහනය කිරීමද අවහිර කරමින් සමහර ප්‍රදේශවල ගංවතුර සහ නායයෑම් ඇතිවිය.

සියයට 18.4 ක නාමික වර්ධනයක් දක්වමින්, පවත්නා වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) රුපියල් බිලියන 2,802 ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම ඉහළ වර්ධන අනුපාතය, ඉහළ ගිය මූර්ත ආර්ථික වර්ධනය සහ විශේෂයෙන්ම වසරේ දෙවන අර්ධය තුළ මිල මට්ටමේ වැඩිවීම මගින් පිළිබිඹු විය.

2006 සඳහා ඒක පුද්ගල ද.දේ.නි. රුපියල් 140,894 ක් ලෙස ඇස්තමේන්තුකර ඇති අතර, එය සියයට 17.1 ක වර්ධනයකි. එ. ජ. ඩොලර් අගයෙන් ඒක පුද්ගල ද.දේ.නි. 2005 වසරේ එ. ජ. ඩොලර් 1,197 සිට 2006 වසරේ එ. ජ. ඩොලර් 1,355 දක්වා සියයට 13.2 කින් වර්ධනය විය.

ආර්ථික කටයුතුවල ප්‍රසාරණය ශ්‍රම වෙළෙඳපොළ කෙරෙහි ධනාත්මක ලෙස බලපාන ලදී. 2005 වසරේ සියයට 7.3 ක් වූ සේවා වියුක්ති අනුපාතය 2006 වසරේදී සියයට 6.5 දක්වා පහත වැටුණි.

2.1 රූප සටහන — වාර්ෂික වර්ධන අනුපාතික



ආර්ථිකයේ නිෂ්පාදිත සියලුම භාණ්ඩ වල මිල වෙනස්වීම මනිනු ලබන ද.දේ.නි. අවධමනකය, 2005 වසරේදී සියයට 9.9 ක අනුපාතය සමග සැසඳීමේදී 2006 වසරේදී සියයට 10.3 කින් වැඩි විය. පසුගිය වසර හා සැසඳීමේ දී පතල් සහ විදුලි සංදේශ උප අංශ හැර අනෙකුත් අංශයන්හි මිල වැඩිවීම් වාර්තා කළේය. බොහෝ නිමි භාණ්ඩ හා සේවාවන්හි මිල වැඩිවීමට ඉන්ධන සහ අමුද්‍රව්‍ය පිරිවැය ඉහළ මට්ටමක පැවැතීම සමග ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණයවීම ද හේතුවිය.

ඉහළ පාරිභෝජන සහ ආයෝජන ඉල්ලුම, 2006 වසරේ ආර්ථිකයේ ඉහළ ප්‍රසාරණයට අනුබලයක් විය. අඩු නිෂ්පාදන වියදම් සහිත රටවල් සමඟ තියුණු තරඟකාරිත්වය මැද අපනයන මධ්‍යස්ථ ලෙස වර්ධනය වුවත්, සියයට 7 කට වඩා වැඩි අනුපාතයකින් ආනයන වර්ධනය විය.

ප්‍රධාන වශයෙන් ඉහළ මට්ටමක පැවති වැටුප්, වෙළෙඳ භාණ්ඩ මිල ගණන් සහ සංස්ථාපිත අංශයේ ලාභදායකත්වය හේතුවෙන් කුටුම්භ සහ සංස්ථාපිත අංශ දෙකේම වැය කළ හැකි ආදායම ඉහළ යාම, පෞද්ගලික පරිභෝජනයේ ඉහළ වර්ධනයට දායක විය. වැඩිකළ වැටුප් සහ ගංවතුර, නායයෑම් හා නැගෙනහිර දැනට පවත්නා ආරක්ෂක තත්ත්වය හේතුකොටගෙන අවතැන්වූවන් පුනරුත්ථාපන වියදම් ඉහළයාම යනාදිය නිසා රාජ්‍ය පරිභෝජනය සියයට 30 කින් වර්ධනය විය.

ආයෝජන වියදම ඉහළ අනුපාතයකින් වර්ධනය වීම 2006 වසරේදී ද නොකඩවා පැවැතිණි. ප්‍රධාන වශයෙන් පෞද්ගලික ආයෝජන වල සියයට 31.7 ක ශක්තිමත් වර්ධනය හේතුකොට ගෙන මුළු ආයෝජන ද.දේ.නි. හි ප්‍රතිශතයක් වශයෙන් සියයට 26.5 සිට සියයට 28.7 දක්වා වැඩි විය. රාජ්‍ය ආයෝජන වැඩි වීම සියයට 8.5 ක් විය. එහෙයින්, ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික ආයෝජන සියයට 22.3 සිට සියයට 24.8 දක්වා වැඩිවූ අතර, රාජ්‍ය ආයෝජන 2005 වසරේ වූ සියයට 4.2 සිට සියයට 3.8 දක්වා පසු බැසීය.

විදේශීය ශුද්ධ සාධක ආදායම ද.දේ.නි. යට එකතු කිරීමෙන් ගණනය කරනු ලබන දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.), ද.දේ.නි. වර්ධනයට වඩා අඩු අනුපාතයකින්, එනම්, සියයට 7.0 කින් වර්ධනය විය. විදේශීය ශුද්ධ සාධක ආදායම සෘණ අගයක්ව පැවැතුණ අතර, 2006 වසරේදී එය තවදුරටත් සියයට 31.1 කින් ක්ෂය විය. මෙය ප්‍රධාන වශයෙන් ණය සේවා සඳහා මුදල් පිටතට ගලායෑම ඉහළයාමත්, ලාභ හා ලාභාංශ පිටතට ගලායාමත් නිසා සිදුවිය.

2006 වර්ෂයේදී පාරිභෝජන වියදම් අධිකව තිබියදීත්, පෞද්ගලික දේශීය ඉතුරුම් බිලියන 550 ක් දක්වා වර්ධනයවීම නිසා දේශීය සහ ජාතික ඉතුරුම් දෙ අංශයම වැඩි විය. ද.දේ.නි.හි ප්‍රතිශතයක් වශයෙන් රාජ්‍ය නිර් - ඉතුරුම් නොකඩවා පහත වැටුණි.

2.1 සංඛ්‍යා සටහන

ස්ථාවර (1996) සාධක වියදම් මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය

අංශය	වෙනස්වීමේ අනුපාතය (%)		ද.දේ.නි.හි වෙනස්වීමේ දායකත්වය (%)		ද.දේ.නි.යට දායකත්වය (%)	
	2005 (අ)	2006 (ආ)	2005 (අ)	2006 (ආ)	2005 (අ)	2006 (ආ)
කෘෂිකාර්මික	**1.9**	**4.7**	**5.8**	**11.1**	**17.2**	**16.8**
1 **කෘෂිකර්මය, දැව ආදී වන ද්‍රව්‍ය සහ ධීවර කර්මාන්තය**	**1.9**	**4.7**	**5.8**	**11.1**	**17.2**	**16.8**
1.1 කෘෂිකර්මය	9.4	0.5	21.6	1.0	14.3	13.4
තේ	2.5	- 1.9	0.5	- 0.3	1.2	1.1
රබර්	10.8	4.2	0.6	0.2	0.4	0.3
පොල්	- 2.2	7.6	- 0.4	1.2	1.1	1.2
වී	24.4	2.1	10.4	0.9	3.0	2.9
අනෙකුත්	7.5	- 0.8	10.5	- 0.9	8.6	7.9
1.2 දැව ආදී වන ද්‍රව්‍ය	1.7	4.9	0.5	1.1	1.7	1.6
1.3 ධීවර කර්මාන්තය	- 42.2	51.7	- 16.3	8.9	1.3	1.8
කාර්මික	**8.3**	**7.2**	**36.6**	**26.3**	**27.0**	**27.0**
2 **පතල් සහ කැනීම් කටයුතු**	**14.1**	**8.0**	**4.0**	**2.0**	**1.9**	**1.9**
3 **නිමැවුම් කර්මාන්ත**	**6.0**	**5.3**	**16.3**	**11.8**	**16.3**	**16.0**
3.1 තේ, රබර් සහ පොල් මද නිෂ්පාදන සැකසීම්	2.7	1.1	0.8	0.2	1.7	1.6
3.2 නිෂ්පාදන කර්මාන්ත	6.1	5.9	13.6	10.7	13.4	13.2
3.3 කුඩා කර්මාන්ත	9.8	5.3	1.9	0.9	1.2	1.2
4 **විදුලිය සහ ජලය**	**24.5**	**20.2**	**5.9**	**4.7**	**1.7**	**1.9**
4.1 විදුලිය	27.7	22.2	5.8	4.6	1.5	1.7
4.2 ජලය	3.8	4.2	0.1	0.1	0.2	0.2
5 **ඉදිකිරීම්**	**8.9**	**8.0**	**10.3**	**7.8**	**7.2**	**7.2**
සේවා	**6.2**	**8.3**	**57.6**	**62.6**	**55.7**	**56.2**
6 **තොග හා සිල්ලර වෙළෙඳාම සහ හෝටල් හා ආපනශාලා**	**2.8**	**5.9**	**10.3**	**17.3**	**21.6**	**21.4**
6.1 ආනයන වෙළෙඳාම	2.3	7.5	3.8	10.0	9.8	9.8
6.2 අපනයන වෙළෙඳාම	6.9	4.4	2.8	1.5	2.5	2.4
6.3 දේශීය වෙළෙඳාම	4.6	4.5	6.9	5.4	8.8	8.6
6.4 හෝටල් සහ ආපන ශාලා	- 27.5	6.3	- 3.2	0.4	0.5	0.5
7 **ප්‍රවාහනය, ගබඩා කිරීම සහ සන්නිවේදනය**	**11.7**	**13.1**	**28.4**	**27.2**	**15.3**	**16.2**
7.1 ප්‍රවාහනය	3.3	5.1	4.4	5.4	7.9	7.7
7.2 භාණ්ඩ මෙහෙයවීම සහ ගබඩා කිරීම	8.4	13.2	1.3	1.7	1.0	1.0
7.3 තැපැල් සහ විදුලි සංදේශ	24.7	22.7	22.7	20.1	6.5	7.4
8 **මූල්‍ය සේවා, දේපල වෙළෙඳාම් සහ ව්‍යාපාරික සේවා**	**6.5**	**9.7**	**12.6**	**15.5**	**11.7**	**12.0**
8.1 මූල්‍ය සේවා	7.5	10.5	11.5	13.5	9.5	9.7
8.2 දේපල වෙළෙඳාම්, බදු දීම් සහ ව්‍යාපාරික සේවා	2.8	6.2	1.1	1.9	2.3	2.3
9 **රාජ්‍ය පරිපාලනය, අනෙකුත් රාජ්‍ය සේවා හා ආරක්ෂක කටයුතු සහ අනෙකුත් ප්‍රජා, සාමාජීය හා පෞද්ගලික සේවා**	**5.4**	**2.8**	**6.4**	**2.6**	**7.0**	**6.7**
9.1 රාජ්‍ය පරිපාලනය, අනෙකුත් රාජ්‍ය සේවා සහ ආරක්ෂක කටයුතු	5.1	1.5	3.7	0.9	4.3	4.1
9.2 අනෙකුත් ප්‍රජා, සාමාජීය සහ පෞද්ගලික සේවා	6.0	4.8	2.6	1.7	2.7	2.6
දළ දේශීය නිෂ්පාදිතය	**6.0**	**7.4**	**100.0**	**100.0**	**100.0**	**100.0**
විදේශීය ශුද්ධ සාධක ආදායම	- 46.2	- 31.1				
දළ ජාතික නිෂ්පාදිතය	**5.6**	**7.0**				

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

මේ අතර, ආයෝජන මෙරටට ගලාඒමට වඩා භාණ්ඩ හා සාධක නොවන සේවාවන්හි ශුද්ධ ආනයන වටිනාකම ඉහළයාමේ ප්‍රතිඵලයක් ලෙස 2006 වසරේදී ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස ඉතුරුම් පහළ අගයක පැවැතිණි.

2.2 ආංශික ප්‍රතිපත්ති, ආයතනික පහසුකම් සහ ගැටළු

ඉහළ ආර්ථික වර්ධනයන් සාක්ෂාත් කර ගැනීම සහ ආයෝජන ඉහළයාම 2006 දී ළඟා කරගත් පැසසිය යුතු වර්ධනයකි. මෙම ඉහළ වර්ධන ප්‍රවණතාවය අඛණ්ඩව පවතින හෙයින්, මධ්‍ය කාලීනව ආර්ථිකය සියයට 8 ඉක්ම වූ වේගයකින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. කෙසේ නමුත් පවත්නා අඩු දේශීය ඉතුරුම් අනුපාතය පිළිබඳව සලකන විට අපේක්ෂිත ඉහළ වර්ධනය ළඟාකරගැනීම සඳහා අවශ්‍ය ඉහළ ආයෝජන ප්‍රමාණය සපුරාලීම සඳහා විදේශ ආයෝජන ලබා ගැනීම ඉතා වැදගත් වනු ඇත. එම නිසා ආයෝජනයට හිතකර ආර්ථික වාතාවරණයක් හා ආයෝජකයන්ගේ විශ්වාසනීයත්වය ඉහළ මට්ටමක පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා උතුරේ

අර්බුදයට ස්ථිරසාර සාමයක් ළඟාකර ගැනීම, ආයෝජන දිරිගැන්වීමට අවශ්‍ය මූලික ක්‍රියා මාර්ග වේගවත්ව ක්‍රියාත්මක කිරීම, ඉහළ රාජ්‍ය මූල්‍ය විනය ඇතුළත් දූරදර්ශී සාර්ව ආර්ථික කළමනාකරණය, වඩා හොඳ දේශපාලන ස්ථාවරත්වය සහ විශේෂයෙන්ම බලශක්ති හා මහා මාර්ග වැනි යටිතල පහසුකම් දියුණු කිරීම යනාදිය ආර්ථිකයේ අනාගත ශක්‍යතාවය ඉහළ නැංවීමට තීරණාත්මක සාධක වනු ඇත.

කෘෂිකර්මය

පාරිභෝගිකයින්ට සුරක්ෂිත ආහාර නිෂ්පාදන සැපයීම සහ රටෙහි ආහාර සුරක්ෂිතභාවය සහතික කරන අතර ඵලදායීතාවය වැඩි කිරීම සහ අනෙකුත් වර්ධනයන් තුළින් ගොවිජනතාවගේ ජීවන තත්ත්වය සහ ආදායම ඉහළ නැංවීම රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තියෙන් අවධාරණය කෙරේ. මෙම ප්‍රතිපත්තියට අනුකූලව, 2006 වසර තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කෘෂිකාර්මික පර්යේෂණ පැවැත්වීම, ව්‍යාප්ති සේවාවන් පුළුල් කිරීම, වැඩි ඵලදාවක් ලබාදෙන බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම, නිෂ්පාදන ප්‍රමිති හා තත්ත්ව සහතික නිකුත් කිරීම සහ වගා ආරක්ෂක වැඩසටහන් ආදිය ඇතුළත් ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. වියළි දේශගුණික තත්ත්වයන් පවතින ප්‍රදේශ සහ ලවණ මිශ්‍රිත පාංශු තත්ත්වයන්ට සුදුසු ආකාරයේ වී ප්‍රභේද නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රමුඛතාවයක් දුන් අතර 2006 වසර තුළ එවැනි වී ප්‍රභේද 7 ක් හඳුන්වා දෙන ලදී. හොඳ තත්ත්වයේ බීජ සහ පැළ වර්ග ලබාදීම සඳහා හොරණ, සීතාඑළිය, ගිරාඳුරුකෝට්ටේ සහ ලබුදූව බීජ ගොවිපොළවල් සහ මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ ආයතනය සංවර්ධනය කිරීම සඳහා පියවර ගෙන තිබේ. කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා විශේෂිත කෘෂිකාර්මික නිෂ්පාදන කලාප පිහිටුවීමට ද පියවර ගෙන ඇත.

කෘෂිකර්මාන්තය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා 2007 අයවැය මගින් ප්‍රතිපත්ති මාලාවක් යෝජනා කර තිබේ. ආනයනික කිරිපිටි සඳහා වූ තීරුබදු සහන ක්‍රමිකව ඉවත් කිරීම, ඉහළ වටිනාකමක් සහිත කෘෂි නිෂ්පාදනයන් සහ පිරිසැකසුම් කටයුතු ප්‍රවර්ධනය කිරීම, එම කටයුතුවල යෙදී සිටින ගොවීන් සඳහා ණය සැපයීම, යන්ත්‍ර සහ උපකරණ සඳහා බදු සහන ලබාදීම සහ කෘෂිකර්මය, පශු සම්පත්, මිරිදිය ධීවර කර්මාන්තය, ඉස්සන් වගාව, පලතුරු වගාව, එළවළු වගාව, මල් වැවීම, බීජ නිෂ්පාදනය සහ කාබනික පොහොර නිෂ්පාදනය යන අංශවල ව්‍යාප්ති සේවා පුළුල් කිරීම මෙම ප්‍රතිපත්තීන්වලට ඇතුළත් වේ. සහල් පිටි සැකසුම් නවීකරණය කිරීම සඳහා දේශීයව නිෂ්පාදනය නොකරනු ලබන හඳුනාගත් යන්ත්‍ර සූත්‍ර ආනයනය එකතු කළ අගය මත බදු (VAT) සහ ආනයන බදුවලින් නිදහස් කිරීම ඇතුළුව අතිරේක දිරිගැන්වීම් ද ලබාදී ඇත. පලතුරු සහ එළවළු වගාව සංවර්ධනය කිරීම සඳහා එම නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථාන සමග කුඩා පරිමාණ ගොවියන් සම්බන්ධ කෙරෙන සංවිධාන රාමුවක් පදනම් කරගනිමින් බදු හා අනෙකුත් දිරිගැන්වීම් ලබාදීම මගින් කුඩා පරිමාණයේ ගොවිපොළවල් පිහිටුවීම දිරිමත් කිරීමට කටයුතු කරනු ඇත. ආයෝජකයින් වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කරගැනීම සඳහා කෘෂි නිෂ්පාදන සැකසීම සහ අගය එකතු කිරීම මගින් ලැබෙන ආදායම ඇතුළු කෘෂිකාර්මික ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබීය.

2006 දී පොහොර සහනාධාරය පුළුල් කෙරුණු අතර එමගින් හිතකර මෙන්ම අහිතකර ප්‍රතිඵල ද ඇතිකරනු ලැබීය. කිලෝ ග්‍රෑම් 50 ක ඕනෑම පොහොර මිටියක් රුපියල් 350 ක සහන මිලකට ලබාගැනීමට ගොවිජන සේවා මධ්‍යස්ථානවල ලියාපදිංචි වූ වී ගොවියන් සුදුසුකම් ලැබීය. යල කන්නයේදී කුඹුරුවල මිරිස්, බඩඉරිඟු, එෑණු, ලොකු එෑණු සහ එළවළු වැනි අතිරේක ආහාර බෝග වගා කිරීම ආවරණය වන පරිදි තවදුරටත් මෙම සහනාධාරය පුළුල් කෙරිණි. පසුව අක්කර 5 කට වඩා අඩු තේ, රබර් සහ පොල් ඉඩම් හිමි සුළු පරිමාණ වැවිලි කරුවන්ටද කිලෝ ග්‍රෑම් 50 ක යූරියා මිටියක් රුපියල් 1,200 ක සහන මිලකට සපයන ලදී. අධික ලෙස සහනාධාර ලබාදීම සම්පත් අකාර්යක්ෂම ලෙස බෙදී යාමට හේතු විය හැකිය. විවිධ බෝග සඳහා විවිධ සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීම සමහර නිෂ්පාදකයින් අතෘප්තිමත්වීමට මෙන්ම වෙළෙඳපොළ විකෘතිතා ඇතිවීමට ද මග පාදනු ඇත. මීට අමතරව, සහනාධාර සපයන අංශවල තාක්ෂණික දියුණුව ඇණහිටීමකට තුඩුදිය හැකි අතර, එය පාරිසරික හානි අවම කරන ප්‍රතිපත්ති වෙත යොමුවීම සඳහා බාධාවක්වීමට මෙන්ම බෝග විශේෂීකරණය ඉහළයාමට සහ කෘෂි ජෛව විවිධත්වය අඩුවීමට ද හේතු විය හැකිය. මේ නිසා, දේශීය වශයෙන් ලබාදෙන සහයෝගය අඩුවීම නිෂ්පාදන විවිධාංගීකරණය සඳහා හිතකර වන අතර එමගින් කෘෂි ජෛව විවිධත්වය ද වර්ධනය වනු ඇත.

පාරිභෝගිකයින් මෙන්ම නිෂ්පාදකයින් ආරක්ෂා කිරීම සඳහා තිරසාර සහ සාධාරණ අලෙවිකරණ හා විකුණුම් ජාලයක් ස්ථාපිත කිරීම ඉලක්ක කරගනිමින් රජය පියවර කිහිපයක් ගනු ලැබීය. කෘෂි නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් සහතික කිරීමට සහ අලෙවිකරණය ඉහළ නැංවීම සඳහා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය පිහිටුවනු ලැබීය. වී කිලෝ ග්‍රෑමයක් රුපියල් 16.50 - 17.50 අතර මිලකට මිලදී ගැනීම සඳහා රජය විසින් 2006 දී රුපියල් දශ ලක්ෂ 3,387 ක් වෙන් කරන ලදී.

සමහර දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනවලට ආරක්ෂණය සැපයීම සඳහා රජය විසින් තීරු බදු ගැලපුම් සිදුකරන ලදී. සහල් ආනයන මත වූ කිලෝ ග්‍රෑමයකට රුපියල් 9 ක විශේෂිත බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 20 දක්වා ඉහළ නැංවූ අතර තිරිඟු පිටි ආනයන මත තීරු බද්ද සියයට 2.5 සිට සියයට 15 දක්වා වැඩි කිරීම හෝ කිලෝ ග්‍රෑමයකට රුපියල් 4.50 ක බද්දක් අය කිරීම යන බදු අනුපාතික අතරින් ඉහළ අනුපාතිකය ක්‍රියාත්මක කරන

ලදී. තිරිඟු ඇට ආනයනය මත තීරු බදු සියයට 2.5 සිට සියයට 6 දක්වා වැඩිකරන ලදී. දේශීය ලොකු එෑණු ගොවියන්ට සාධාරණ මිලක් සහතික කිරීම සඳහා ලොකු එෑණු ආනයනය මත තීරු බදු කිලෝ ග්‍රෑමයකට රුපියල් 10 සිට කිලෝ ග්‍රෑමයකට රුපියල් 20 දක්වා වැඩිකළ අතර ලොකු එෑණු ආනයනයේදී කිලෝ ග්‍රෑමයකට රුපියල් 10 ක සෙස් බද්දක් ද හඳුන්වා දෙනු ලැබීය.

වැවිලි අංශයෙහි එකතු කළ වටිනාකම ඉහළ නැංවීම සඳහා තවදුරටත් දිරිගැන්වීම් ලබාදෙන ලදී. තේ, රබර් සහ පොල් සැකසුම් කර්මාන්ත ශාලා නවීකරණය සඳහා ආනයනය කරන යන්ත්‍රෝපකරණ එකතු කළ අගය මත බදු සහ තීරු බදුවලින් නිදහස් කරන ලදී. 2007 අයවැයට අනුව ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි තේ, රබර් සහ පොල් සැකසුම් කර්මාන්ත සඳහා අදාළ වන ආර්ථික සේවා ගාස්තු ද (ESC) සියයට 0.5 සිට සියයට 0.25 දක්වා අඩු කරනු ලැබීය. ඉහළ යන බලශක්ති පිරිවැය පාලනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙහි ආධාරයෙන් විදුලිබල සහ බලශක්ති ඉතුරුම් තාක්ෂණයන්හි ආයෝජන සඳහා රජය සහයෝගය දැක්වීය.

ජාත්‍යන්තර වශයෙන් අධි තේ සැපයුමක් පවතින හෙයින් තේ නිෂ්පාදනය වැඩිකිරීමට වඩා තේවල ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීමේ වැඩසටහන්වලට ප්‍රමුඛත්වය දෙනු ලැබීය. උපද්‍රව විශ්ලේෂණ සහ අවධි ලක්ෂ්‍යය පාලන පද්ධතිය (Hazard Analysis and Critical Control Point - HACCP) පිළිබඳ සහතිකය ලබා ගැනීම සඳහා තේ කම්හල් නවීකරණය කිරීම පිණිස තේ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සහන පොළී අනුපාතිකයකට ණය පහසුකම් සලසනු ලැබීය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, තේ කම්හල් 661 කින් 34 ක් පමණ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ අනිකුත් පිළිගත් ආයතනවලින් උපද්‍රව විශ්ලේෂණ සහ අවධි ලක්ෂ්‍යය පාලන පද්ධතිය පිළිබඳ සහතිකය ලබාගෙන තිබේ. කපා ඉරා අඹරන ලද තේ (CTC) නිෂ්පාදනයෙහි සහ තේවල එකතු කළ වටිනාකම ඉහළ නැංවීම සඳහා මෙන්ම CTC තේ සඳහා ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් කම්හල්වල දැනට පවතින පහසුකම් වෙනස් නොකර CTC තේ සැකසීමේ අතිරේක අංශයක් පවත්වාගෙන යාමට අවසර දී තිබේ.

පොල් වගාව යටතේ පවතින බිම් ප්‍රමාණය වසර කිහිපයක් තුළදී අක්කර දශ ලක්ෂය දක්වා ඉහළ නැංවීම රජයේ ඉලක්කය වේ. මෙම වැඩසටහන යටතේ, 2006 දී සුදුසුකම් සපුරා ඇති පොල් වගාකරුවන්ට රජය මගින් නොමිලේ පොල් පැළ සහ පොහොර ලබාදෙන ලදී. මේ සඳහා අවශ්‍ය මුදල් සෙස් අරමුදලින් වෙන්කරනු ලැබීය. පොල් වගාකරුවන්ට පොල් පැළ ලබාගැනීම සඳහා විවිධ ප්‍රදේශවල පොල් තවාන් 35 ක් පවත්වාගෙන යනු ලැබූ අතර පොල් පැළ සහන මිලකට විකුණන ලදී. වැඩි පිරිසක් පොල් වගාවට ආකර්ෂණය කරගැනීම සඳහා 2006 පොල් සහනාධාර වැඩසටහන් සංශෝධනය කෙරිණි. නව ප්‍රවේශයක් වශයෙන්, රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ සංවිධානවල සහයෝගිතාවය ඇතිව සුනාමියෙන් විනාශයට පත්වූ පොල් වගා බිම් යථාතත්ත්වයට පත් කෙරුණු අතර කොටස් කළ ඉඩම් සහ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ඉඩම්වල නැවත පොල් වගාකිරීමේ වැඩසටහන් දියත් කෙරිණි. වැසි ජලය එක්රැස් කරගැනීම සහ පොල් වගා බිම්වල ග්ලිරිසීඩියා, සිටුවීම් සඳහා දිරිගැන්වීම් ලබාදීම 2006 දී තවදුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක විය.

ධීවර අංශය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් හඳුන්වා දෙන ලදී. ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමේ ධාරිතාවය ඉහළ නැංවීම පිණිස බහු දින ධීවර යාත්‍රා 55 ක් බෙදා දුන් අතර මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වැව්වලට මත්ස්‍ය පැටවුන් මුදාහරින ලදී. පුත්තලම් දිස්ත්‍රික්කයේ ඉස්සන් කොටු ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මුන්දලම උතුරු ප්‍රදේශයේ සිට පලාලිය දක්වා වූ කිලෝමීටර් 14 ක් දිගැති අධික ලෙස රොන්මඩ පිරුණු ඇල ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන ලදී. විසිතුරු මත්ස්‍ය ව්‍යාපෘති හරහා ඉහළ එකතු කළ වටිනාකමක් සහිත අපනයන සහ ස්වයං රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා විසිතුරු මත්ස්‍ය හුවමාරු මධ්‍යස්ථානයක් විවෘත කරන ලදී. ඉවත් කරන මත්ස්‍ය කොටස් භාවිතාකරන සත්ව ආහාර නිෂ්පාදනාගාරයක් බේරුවල ධීවර වරායෙහි ස්ථාපිත කරන ලදී. දේශීය වශයෙන් ඉස්සන් සැපයුම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලද අතර ඉස්සන් ආනයනය මත සෙස් බද්දක් පනවනු ලැබීය.

දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා රජය පියවර ගනිමින් සිටී. මේ වන විට, දේශීය කිරි නිෂ්පාදනය ප්‍රමාණවත් වන්නේ මුලු ඉල්ලුමෙන් සියයට 20 ක පමණ ප්‍රමාණයක් සපුරාලීම සඳහා පමණක් වන අතර 2010 දී මෙම මට්ටම සියයට 30 ක් දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. කිරි අලෙවිකරණය පුළුල්කරන අතරම දේශීය එළ ගවයන්ගේ සහ මී ගවයන්ගේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබීය. ගවයන් සහ එළුවන් අභිජනනය සඳහා අවශ්‍ය කලල ආනයනය එකතු කළ අගය මත බදුවලින් සහ තීරු බදුවලින් නිදහස් කරනු ලැබීය. සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පශු වෛද්‍ය වෛද්‍යවරුන් 177 ක් බඳවා ගැනීමට සහ රටෙහි සත්ව සෞඛ්‍යය වර්ධනය කිරීම සඳහා දිස්ත්‍රික්කයකට පශු විමර්ශන මධ්‍යස්ථානයක් බැගින් ඉදිකිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගෙන තිබේ. සත්ව සංඛ්‍යාව ඉහළ නැංවීම පිණිස ක්‍රියාකිරීම සඳහා පෞද්ගලික අංශය ධෛර්යමත් කරන අතර සත්ව රෝග පාලනය, යෙදවුම් සහ නිමවුම්වල තත්ත්වය සහතික කිරීම වැනි නියාමන කාර්යයන් කිරීමට පමණක් රාජ්‍ය අංශයේ කාර්යභාරය සීමා කරනු ඇත.

තරගකාරිත්වය සහ ඵලදායීතාවය වර්ධනය කිරීම ඉලක්ක කරගත් ප්‍රතිපත්තීන් තුළින් තිරසාර කෘෂිකාර්මික

වර්ධනයක් ළඟාකරගත හැකිය. කෘෂිකාර්මික පර්යේෂණ මගින් ස්වභාවික සම්පත් මනා ලෙස කළමනාකරණය කිරීම සඳහා උපාය මාර්ග සකස් කිරීම සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන්හි ඵලදායීතාවය වර්ධනය කිරීම ඉලක්ක කරගැනීම අවශ්‍ය වේ. මේ සඳහා ඉල්ලුම මත පදනම් වූ ව්‍යාප්ති සේවාවන් ධෛර්යමත් කිරීම, යෙදවුම් වඩා කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම සහ පසු අස්වනු නාස්තිය අවම කිරීම අවශ්‍ය වේ. හිතකර නවීන තාක්ෂණය භාවිතා කිරීම, නව දෙමුහුන් බීජ සහ පාංශු කළමනාකරණ තාක්ෂණයන් වර්ධනය කිරීම, සුළු පරිමාණ වාරි ජලාශ ප්‍රතිසංස්කරණය කිරීම, ජල කළමනාකරණ ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ පසෙහි ලවණ ස්වභාවය අඩු කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ. ගුණාත්මක බවින් අඩු බීජ භාවිතය, කෘමි උවදුරු සහ රෝග අවිධිමත් ලෙස කළමනාකරණය සහ වැරදි හෝ ප්‍රමාණවත් නොවන පොහොර භාවිතය ආදිය කෘෂිකාර්මික නිෂ්පාදන රාශියක විශේෂයෙන්ම, එළවළු වගාවේ ඵලදායීතාවය අඩුවීමට හේතු වී තිබේ.

පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඉහළ නැංවීමට අවශ්‍ය පහසුකම් සැලසීම තුළින් ජාතික අයවැය මත ඇති පීඩනය අවම කළ හැකිය. වී මිලදී ගැනීමේ යාන්ත්‍රණය යටතේ වෙළෙඳපොළ මිල ගණන් නොසලකා ගොවියන් විසින් සපයනු ලබන හොඳ තත්ත්වයේ වී රජයේ ප්‍රකාශිත මිලට මිලදී ගැනීමට රජයට සිදුවේ. අතිරික්ත තොග නඩත්තු කිරීම සහ ගබඩා කිරීම් ආශ්‍රිත පිරිවැය මෙන්ම මෙම මිලදී ගැනුම් මූල්‍යනය කිරීම බොහෝ විට ගැටළුකාරී සහ ජාතික අයවැය මත අධික පීඩනයක් ඇති කරවන සුළුය. තවද, රාජ්‍ය අංශයේ මැදිහත්වීම ගොවියන්ගේ සුභසාධනයට කෙරෙන බලපෑම සමහර විට ඉතා සුළු වීමට හෝ ඇතැම් විට ඍණාත්මක වීමටද ඉඩ ඇත. එබැවින්, වී අලෙවිකරණයේදී පෞද්ගලික අංශයේ සහභාගිත්වය ධෛර්යමත් කිරීම, ඉදිරි වෙළෙඳපොළ ගිවිසුම් සඳහා ගොවියන් දිරිමත් කිරීම, සහල් ආශ්‍රිත නිෂ්පාදන වැඩිදියුණු කිරීම සහ ඒවා ප්‍රචලිත කිරීම සහ සුපිරි තත්ත්වයෙන් යුත් සහල් නිෂ්පාදනය කිරීම සඳහා සහල් සැකසුම් ධාරිතාවය ඉහළ නැංවීම ආදිය රාජ්‍ය මැදිහත්වීම අඩුකිරීමට උපකාරී වනු ඇත.

නිෂ්පාදන පිරිවැය ඉහළයාම සහ ශ්‍රම හිඟය වැවිලි කර්මාන්ත අංශයෙහි අවධානය යොමුවිය යුතු ප්‍රධාන ගැටළු වේ. බලශක්ති පිරිවැය (දර, විදුලිය, ආදිය) සහ ශ්‍රම පිරිවැය වැඩිවීම නිෂ්පාදන පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළයාමට ප්‍රධාන ලෙස දායක වී ඇත. නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සඳහා ඵලදායීතාවය වර්ධනය කිරීම, බෝග විවිධාංගීකරණය, යටි වගාවන් හඳුන්වාදීම සහ විකල්ප බලශක්ති මූලාශ්‍ර සම්බන්ධ ආයෝජන උපකාරී වනු ඇත. විශේෂයෙන්ම, තේ දළු නෙලීම සහ පොල් කැඩීම, රබර් කිරි කැපීම සහ කුරුඳු තැලීම සඳහා පුහුණු

2.2 රූප සටහන සහල් : සැපයුම සහ ඉල්ලුම



කම්කරුවන් හිඟවීම වැවිලි කර්මාන්ත අංශයෙහි පවතින ප්‍රබලතම බාධාවන්ය. සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 65 කට පමණ දායක වන කුඩා තේ වතු අංශය ශ්‍රම හිඟයකට මුහුණ දී ඇත. ඵලදායීතාවය හා බැඳුනු වැටුප් ව්‍යුහයක් හඳුන්වාදීම මේ සඳහා ප්‍රයෝජනවත් වනු ඇත.

හිතකර කාලගුණික සහ ආයෝජන වාතාවරණය තුළ මිරිදිය සහ විසිතුරු මත්ස්‍ය කර්මාන්තය වේගවත්ව සංවර්ධනය කිරීම සඳහා විශාල විභවතාවයක් පවතී. මිරිදිය මත්ස්‍ය ප්‍රභේද මෙන්ම විසිතුරු මසුන් බෝකිරීම සඳහා සුදුසු භූමි සම්පත් සහ ජල මූලාශ්‍රවලින් සමන්විත ස්වභාවික සම්පත් රටෙහි පවතී. නමුත්, ඇතැම් බාධාවන් හේතුවෙන් මෙම සම්පත් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඵලදායී ලෙස මෙහෙයවීමට නොහැකි වී තිබේ. පර්යේෂණ සහ සංවර්ධන කටයුතු අල්පවීම, ඉල්ලුම සපුරාලීම සඳහා බාධාවකින් තොරව සැපයීමේ නොහැකියාව, තාක්ෂණය පිළිබඳ දැනුම මඳවීම, තොග ප්‍රමාණවත් නොවීම, සමාජයේ පිළිගැනීම අඩුවීම, මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සීමිතවීම සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වය ප්‍රමාණවත් නොවීම ආදිය මෙම තත්ත්වය සඳහා දායක වී ඇති ප්‍රධාන සාධක වේ.

මුහුදු මත්ස්‍ය අංශය තුළ පවතින ඇතැම් දුෂ්කරතා එහි වර්ධන විභවතාවය වළකාලයි. ධීවර කර්මාන්තයෙහි වර්ධනය කඩිනම් කිරීමට නම්, මසුන් ඇල්ලීමේ දී තාක්ෂණික ක්‍රම භාවිතය ප්‍රමාණවත් නොවීම, ධීවර යටිතල පහසුකම් දුර්වල වීම, පසු අස්වනු තාක්ෂණයන් භාවිතා නොකිරීම, ධීවර මෙහෙයුම් සම්බන්ධ දැනුම මඳකම සහ ගොඩ බිමට බෑමේදී ඇතිවන දුර්වලතා යනාදිය සැලකිල්ලට ගත යුතුය. අයිස් නිෂ්පාදනය, ගබඩා මෙන්ම ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත් නොවීම ද, එකතු කළ වටිනාකම වැඩිකිරීම, ගුණාත්මක තත්ත්වය වර්ධනය කිරීම සහ කාර්යක්ෂම ලෙස මාළු බෙදාහැරීමේ කාර්යයන් ඉටුකිරීම සඳහා බාධාවන් වී තිබේ. රජය ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම ප්‍රවර්ධනය කළ ද, සැලසුමකින් තොරව එක් දින බෝට්ටු භාවිතා කිරීම නොගැඹුරු මුහුදේ මසුන් අඩුවීමට හේතු වී ඇත.

කාර්මික

රජයේ දිගුකාලීන කාර්මික ප්‍රතිපත්තිය, ගෝලීය වශයෙන් තරගකාරීවූත්, ගතික සහ තාක්ෂණිකමය ලෙස නවීකරණය වූත් කාර්මික අංශයක් ඇතිකර ගැනීම අරමුණු කරගෙන ක්‍රියාත්මක විය. නිෂ්පාදන ක්‍රියාවලියේ දී හා අදාළ සේවා සැපයීමේ දී නව සොයාගැනීම්වල භාවිතය සහ ඵලදායීතාවය වර්ධනය කිරීම ද කාර්මික ප්‍රතිපත්තිය තුළින් බලාපොරොත්තු වේ. මෙම ක්‍රියාවලියේ දී, විදේශ ආයෝජනයෙන් අපේක්ෂා කරනුයේ ප්‍රාග්ධනය සැපයීම, තාක්ෂණය හා වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීම වැනි ප්‍රධාන අංශයන් ඔස්සේ දායකත්වයක් සැපයීමයි. නීති හා නියාමන රාමුව ශක්තිමත් කිරීම, අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, සමාගම් පරිපාලනය වැඩිදියුණු කිරීම, ගුණාත්මකභාවය ඉහළ නැංවීම හා අදාළ ප්‍රමිතීන් පවත්වාගෙන යාම, කර්මාන්තයන්හි තරගකාරිත්වය වැඩි දියුණු කිරීම, ණය පහසුකම් සඳහා ප්‍රවේශවීමේ හැකියාව වැඩිකිරීම සහ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම වැනි අරමුණු රාශියක් ඔස්සේ මෙම ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා රජය විසින් පියවර කිහිපයක් ගෙන ඇත.

බහු පාර්ශ්වීය, කලාපීය හා ද්විපාර්ශ්වීය සාකච්ඡා ඔස්සේ, 2006 වසරේ දී ශ්‍රී ලංකාවේ අපනයනයන් විදේශීය වෙළෙඳපොළ වෙත ප්‍රවේශවීම තවදුරටත් පුළුල් විය. ලෝක වෙළෙඳ සංවිධානය (WTO) වෙත වූ බැඳීම් එලෙසම පවත්වා ගනිමින් ඉන්දියාව, පකිස්තානය සහ අනෙකුත් කලාපීය රටවල් සමග ද්විපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් හා අදාළ සාකච්ඡාවල නිරත විය. 2006 දී, ඉන්දියාව සමග පැවැති වෙළෙඳ සාකච්ඡා ප්‍රධාන වශයෙන් ඉලක්ක කරගනු ලැබුවේ ඉන්දියාව විසින් ඇතැම් අපනයන සඳහා පනවනු ලැබූ ප්‍රමාණාත්මක සීමාවන් හා සම්බන්ධ ගැටලුව නිරාකරණය කිරීම හා විස්තීරණ ආර්ථික සහයෝගිතා ගිවිසුම (CEPA) පිළිබඳ වැඩිදුර සාකච්ඡාවන් සඳහායි. වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ, ශ්‍රී ලංකාවේ අපනයනය සම්බන්ධයෙන් වූ ප්‍රභවස්ථාන පිළිබඳ දැඩි නිර්ණායක ලිහිල් කිරීම හා අදාළව, යුරෝපා සංගමය සමග සාකච්ඡා පැවැත්විණි. දැනට පවත්නා නිර්ණායක අනුව ඇඟළුම් අපනයන සඳහා අවම වශයෙන් සියයට 50 ක අගයක් දේශීය වශයෙන් එකතු කළ යුතුව ඇත.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය කිරීම සඳහා රජයේ වගකීම, රජය විසින් නිරතුරුවම අවධාරණය කරන ලදී. පුළුල් පදනමක් මත කාර්මිකරණය සහ රැකියා අවස්ථා වැඩි කිරීම සඳහා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය කිරීම ප්‍රායෝගික පිවිසුම් මාර්ගයක් වශයෙන් සලකන අතර, මහා පරිමාණ හා නූතන කාර්මික ව්‍යවසායයන් සමග පුහුණු සම්බන්ධතා පැවැත්වීම තුළින් තාක්ෂණය ලබාගැනීමෙන් මෙම අංශය තවදුරටත් ශක්තිමත් වනු ඇත. තීරු බදු රහිතව භාණ්ඩ ආනයනය, දේශීය කර්මාන්ත විසින් අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීමේ දී විදේශ මුදලින් ගෙවීම් සිදුකිරීම සඳහා පහසුකම් සැලසීම, ඵලදායීතාව වර්ධනය සහ කර්මාන්ත අතර ප්‍රතිලෝම බැඳීම් වැඩිකිරීම සඳහා පහසුකම් සැලසීම වැනි දිරිගැන්වීම් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා ලබා දී තිබේ.

ප්‍රාදේශීය කාර්මීකරණ ප්‍රවර්ධනය සඳහා රජය විසින් පියවර රාශියක් ගෙන ඇත. 2006 දී නව කර්මාන්ත 8 ක් ද අඩපනව තිබූ කර්මාන්ත 6 ක නැවත පන ගැන්වීම ද තවත් කර්මාන්ත 3 ක් පුළුල් කිරීමට ද කටයුතු කළ අතර "නිපැයුම් ශ්‍රී ලංකා" කර්මාන්ත 300 වැඩසටහන යටතේ, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල පවත්වාගෙන ගිය කර්මාන්ත 8 ක් එම දිස්ත්‍රික්ක වලින් පිටත නැවත ස්ථානගත කිරීමට අනුමැතිය ද ලබාදෙන ලදී. වසර 5 - 10 දක්වා ආදායම් බද්දෙන් නිදහස් කිරීම සහ උසස් තාක්ෂණයෙන් යුතු යන්ත්‍රසූත්‍ර ආනයනය කිරීම සඳහා තීරු බදු හා එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම මෙම කර්මාන්ත සඳහා ලබාදුන් දිරිගැන්වීම් අතර වේ. මෙම දිරිගැන්වීම් ආයෝජන මණ්ඩලයට අයත් හා එයට අයත් නොවන ව්‍යාපෘතීන් අතර පවතින දැඩි පරතරය අඩු කිරීමට ගත් පරිශ්‍රමයේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකිය. කර්මාන්ත 300 වැඩසටහන යටතේ ආයෝජන මණ්ඩලයේ ආයෝජකයින් වෙත දෙන ලද සහන දේශීය ආයෝජකයින්ට ද ලබා දී ඇත. නැවත ස්ථානගත කිරීම සඳහා වැය වූ පිරිවැය, එම ආයතනවල බදු ගණනය කරන ආදායමින් අඩු කිරීමට ඉඩ සලසමින්, බස්නාහිර පළාතෙන් පිටත නැවත ස්ථානගත කළ කර්මාන්තශාලා සඳහා දිරිගැන්වීම් ලබා දී ඇත.

2007 අයවැය මගින් දේශීය කර්මාන්ත අංශය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර රාශියක් ගෙන ඇත. රෙදිපිළි නිෂ්පාදනය කරන ආයතන සඳහා දැනට ක්‍රියාත්මක වන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන, රජය හා බැංකු අතර අවදානම බෙදා ගැනීමේ පදනම මත පවත්වාගෙන යාමට අපේක්ෂා කෙරේ. ඇඟළුම් කර්මාන්තයේ ප්‍රතිලෝම බැඳීම් සංවර්ධනය උදෙසා රෙදිපිළි සැකසුම් කලාප පිහිටුවීම කෙරෙහි විශේෂ අවධානය යොමුකර ඇත. තවදුරටත්, ජාතික විද්‍යා සභාවේ අධීක්ෂණය යටතේ, නැනෝ තාක්ෂණ ආයතනයක් පිහිටුවීමට ද 2007 අයවැයෙන් යෝජනා කර ඇත. මෙමගින් රෙදිපිළි, රබර්, විද්‍යුත් භාණ්ඩ සහ බනිජ සම්පත් කර්මාන්තයන්හි තරගකාරිත්වය වැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වෙයි.

බල ශක්තිය වැඩි වශයෙන් යොදාගන්නා කර්මාන්තවලට අන්තර් ජාතික තරගකාරිත්වයට මුහුණදීම, විදුලිය සඳහා අයකරන ගාස්තු සහ ඉන්ධනවල මිල ඉහළයාම හේතුවෙන් විශාල ගැටලුවක් බවට පත්වෙමින් ඇත. මෙම තත්ත්වය මගහැරීම සඳහා 2007 අයවැය මගින් බර ඉන්ධන, දැවිතෙල් සහ විදුලිය ගාස්තු එකතු කළ අගය මත බද්දෙන් (VAT) නිදහස් කර ඇත.

කාර්මික අංශයේ සංවර්ධනය සඳහා අවශ්‍ය ආයතනික පහසුකම් 2006 වසරේදී ද නොකඩවා ලබා දී ඇත.

2006 දී ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මගින් මෙහෙය වූ අපනයන හා ව්‍යාපාර සංවර්ධන සංසදය මගින් ආයෝජකයින් හා ව්‍යවසායකයින් මුහුණ පාන ගැටලුවලට විසඳුම් ලබා දී ඇති අතර ආයෝජන මණ්ඩලය විසින් පවත්වන ලද ආයෝජකයින් සඳහා පහසුකම් සැලසීමේ සංසදය මගින් මධ්‍යම හා පළාත් ආණ්ඩු වලින් ඉඩම් ලබා ගැනීම මෙන්ම පාරිසරික සහ අනිකුත් බලපත්‍ර ලබාගැනීමට අවශ්‍ය සහාය ද ලබාදෙන ලදී. 2004 දී කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද විශේෂ වැඩසටහන රෙදිපිළි හා ඇඟළුම්, පාවහන්, සම් භාණ්ඩ නිෂ්පාදිත, පිඟන්, රබර් සහ දැව හා දැව ආශ්‍රිත කර්මාන්ත යන කර්මාන්තයන්හි තරගකාරිත්වය ඉහළ නැංවීම සඳහා උපකාරී විය. එම වැඩසටහන, එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය (UNIDO), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ කර්මාන්ත තාක්ෂණ ආයතනය සමග එක්ව නිපුණතා සංවර්ධනය, ආහාර නිෂ්පාදන කර්මාන්තය සඳහා තාක්ෂණික සහාය ලබාදීම සහ තත්ත්ව ඇගැයීම හා තත්ත්ව සහතික පිරිනැමීම යනාදිය සඳහා අවශ්‍ය මූල්‍යමය ආධාර සපයන ලදී.

ඉහළ වර්ධනයන් අත්කරගැනීමේ දී කර්මාන්ත අංශය, විවිධ බාධකයන්ට මුහුණ පාමින් සිටී. පිඟන්, සිමෙන්ති සහ වීදුරු වැනි බලශක්ති වැඩි වශයෙන් පරිභෝජන කරන කර්මාන්තවලට, ඉහළ යන බලශක්ති පිරිවැය විශාල ගැටලුවක් ව ඇත. කර්මාන්ත අංශයේ ඉහළ වර්ධනයක් ළඟාකරගැනීම සඳහා විශ්වාසනීය හා පහසු මිලකට බලශක්ති සැපයුමක් පැවතීම ඉතා වැදගත් වේ. ඊට අමතරව, ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම්, ශ්‍රම හා අමුද්‍රව්‍ය පිරිවැය ඉහළයාම, පුහුණු ශ්‍රමයේ හිඟකම, ඉදිකිරීම් කර්මාන්තය තුළ තාක්ෂණිකමය වශයෙන් සුදුසුකම් ලත් පුද්ගලයින්ගේ හිඟකම, ශ්‍රම වෙළෙඳපොළ තුළ පවතින දැඩි රෙගුලාසි හා රාජ්‍ය අංශයේ පවතින අකාර්යක්ෂමතාව යනාදී ගැටලු වලට කඩිනම් පිළියම් යෙදීම ද අත්‍යවශ්‍ය වේ.

කර්මාන්ත අංශයේ ඉදිරි පැවැත්ම ශක්තිමත් කිරීම උදෙසා තවදුරටත් නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ නිමැවුම් කර්මාන්තය, ඇඟළුම්, රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ පිඟන් භාණ්ඩ නිෂ්පාදනය වැනි කර්මාන්ත කිහිපයක් මත දැඩිව රඳා පවතී. එබැවින් බාහිර කම්පනයන්ට ඔරොත්තුදීම සඳහා කර්මාන්ත විවිධාංගීකරණය කිරීම අත්‍යවශ්‍ය වේ.

රට තුළ පවතින ඇතැම් ක්‍රියාපිළිවෙත් ව්‍යාපාරික ගනුදෙනුවල පිරිවැය ඉහළයාමටත්, ආයතනවල කීරණ ගැනීමේ ක්‍රියාවලිය මන්දගාමී වීමටත් හේතු වී ඇත. දැඩි හා සංකීර්ණ ක්‍රියාපිළිවෙත්, අල්ලස් ගැනීම, කාලය මෙන්ම සම්පත් නාස්තිවීමට මග පාදා ඇත. නව ව්‍යාපාර සහ දේපොළ ලියාපදිංචි කිරීම, බලපත්‍ර නිකුත්කිරීම, කම්කරු රෙගුලාසි සහ ආනයන හා අපනයන ආශ්‍රිත ලිපිගොනු පරිහරණය කිරීමේ ක්‍රියාමාර්ග යනාදී අංශ තවදුරටත් පහසු කරවීම අවශ්‍ය වේ. අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේ දී පවතින ප්‍රමාදවීම් හේතුවෙන් ඒ සඳහා වන පිරිවැය ඉහළයාම, පවත්නා නීතිවල සංකීර්ණතාව, වාණිජ කටයුතු හා සම්බන්ධ නීති කටයුතුවල ඇති සීමාන්විත බව යන අපහසුතා කර්මාන්ත අංශය කෙරෙහි බලපා ඇත.

සේවා

යෝජිත යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වේගවත්ව ක්‍රියාත්මක කිරීම ඉහළ ආර්ථික වර්ධනයන් සඳහා අත්‍යවශ්‍ය වේ. කොළඹ දකුණු වරාය, ගල් අඟුරු තාප බලාගාර ව්‍යාපෘතිය, අධිවේගී මාර්ග හා දුම්රිය සේවා වැනි ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති වේගවත් හා තිරසාර සංවර්ධනයක් සඳහා අත්‍යවශ්‍ය වන බැවින් ප්‍රමාදයෙන් තොරව ආරම්භ කළ යුතු වේ. රාජ්‍ය මූල්‍ය ගැටළු නිසා එවැනි ව්‍යාපෘති සඳහා අරමුදල් සපයා ගැනීමට රාජ්‍ය සහ පෞද්ගලික සහයෝගීතාවයන් දිරිගැන්විය යුතු වේ.

මෙහෙයුම් පිරිවැය අඩුකර ගැනීමට සහ රාජ්‍ය අයවැය මත ඇතිකරනු ලබන බලපෑම ලිහිල් කිරීමට ලංකා විදුලි බල මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය සේවය සහ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වැනි යටිතල පහසුකම් සපයනු ලබන ආයතනවල මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිකළ යුතු වේ. ආයතනික වැඩි දියුණු කිරීම් හඳුන්වා දී මූල්‍ය පාලනයන් ශක්තිමත් කිරීම, නාස්තිය මුලිනුපුටා දැමීම, නවෝත්පාදක නිෂ්පාදිත හඳුන්වාදීම සහ වෙනත් අදාළ ක්‍රියාමාර්ග ගැනීම මෙම ආයතනවල මූල්‍ය තත්ත්වය වර්ධනය කිරීම සඳහා උපකාරී වනු ඇත.

2.3 නිෂ්පාදිතය

කෘෂිකර්මය

2006 දී කෘෂිකර්මය, වන සහ ධීවර අංශය සැලකිය යුතු ලෙස යථාතත්ත්වයට පත්වූ අතර එකතු කළ අගය මත සියයට 4.7 ක සතුටුදායක වර්ධනයක් වාර්තා කළේය. සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයෙහි දායකත්වය සියයට 16.8 විය. 2006 වසරේ වාර්තාගත වී අස්වැන්නක් ලැබීම, රබර් සහ පොල් නිෂ්පාදන

2.2 සංඛ්‍යා සටහන **කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශක (1997-2000=100)**

අයිතමය	2005(අ)	2006(ආ)	වර්ධන වේගය(%) 2006/05
කෘෂිකාර්මික සහ මත්ස්‍ය	103.2	108.8	5.4
1. කෘෂිකර්මය	110.2	111.5	1.2
1.1 කෘෂිකාර්මික බෝග	108.8	111.1	2.2
තේ	110.4	108.2	-2.0
රබර්	108.2	113.2	4.6
පොල්	90.6	96.7	6.7
වී	121.8	125.4	2.9
අනෙකුත් බෝග	106.6	108.7	2.0
1.2 පශු සම්පත්	123.4	114.9	-6.9
2. මත්ස්‍ය	59.8	92.0	53.9

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සැලකිය යුතු ලෙස වර්ධනයවීම සහ මත්ස්‍ය නිෂ්පාදනය ශක්තිමත්ව යථාතත්ත්වයට පත්වීම මෙම වර්ධනයට බලපෑ ප්‍රධාන සාධක විය. කෙසේ වෙතත්, අහිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් තේ, එළවළු සහ පලතුරු නිෂ්පාදන ආන්තික වශයෙන් පහළයාම සහ කුකුළු නිෂ්පාදන සුළු වශයෙන් පහත වැටීම කෘෂිකාර්මික අංශයේ වර්ධනය සීමාකිරීමට හේතු විය.

අපනයන කෘෂිකර්මය

2006 දී තේ නිෂ්පාදනය සුළු වශයෙන් අඩුවිය. පොහොර සහනාධාරය සංශෝධනය කිරීම, කාලගුණ තත්ත්වය දැඩි වෙනස්වීම්වලට භාජනයවීම සහ වසරේ අග භාගයේදී පැවැති කම්කරු වැඩ වර්ජනය නිසා තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 311 දක්වා සියයට 2 කින් අඩු වුවද, එය පසුගිය වසර 5 තුළ තේ නිෂ්පාදනයේ සාමාන්‍යය අගයට වඩා ඉහළ මට්ටමක පැවැතුණි.

1996 න් පසුව වැඩිම නිෂ්පාදන මට්ටම වාර්තා කරමින් 2006 දී රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 109 දක්වා සියයට 4.6 කින් අඛණ්ඩව වර්ධනය විය. ප්‍රධාන වශයෙන්, ආකර්ෂණීය මිල ගණන් සහ ඉල්ලුම වැඩිවීම හේතුවෙන් රබර් කිරි කැපීම වැඩි කිරීම, වැසි ආවරණ භාවිතය, ඵලදාව වැඩි නව ප්‍රභේද වගා කිරීම සහ පොහොර යෙදීම වැනි ඵලදාව ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග මාලාවකට රබර් වගා අංශය යොමු විය. නිෂ්පාදනය වැඩිවීමට හිතකර කාලගුණය ද ප්‍රධාන විය. බොරතෙල් මිල සැලකිය යුතු ලෙස ඉහළයාම කෘත්‍රිම රබර් මිල ඉහළයාමට ද හේතු විය. ජාත්‍යන්තර මිල ගණන්වල ඉහළයාමට ප්‍රතිචාර දක්වමින් 2006 දී රබර් අපනයනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 47 දක්වා සියයට 48 කින් තියුණු ලෙස වැඩිවිය. මිල ගණන් ඉහළ ගියද ජාත්‍යන්තර සහ දේශීය වෙළෙඳපොළවල රබර් මිල අධික ලෙස උච්චාවචනය විය. කෙසේ වුවද, නිෂ්පාදන පිරිවැය ඉහළ යාමක් ද පෙන්නුම් කළේය. ජාත්‍යන්තර වෙළෙඳපොළේ රබර් මිල උච්චාවචනයවීම හමුවේ රබර් කර්මාන්තය සාර්ථකව පවත්වාගෙන යාම සඳහා රබර් වගාවේ ඵලදායීතාවය තවදුරටත් වැඩිකිරීම අවශ්‍ය වේ.

පොල් වගා කරන බොහෝ ප්‍රදේශවලට ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබීමේ පසුකාලීන බලපෑම් හේතුකොටගෙන 2006 දී පොල් නිෂ්පාදනය සියයට 6.7 කින් වැඩිවිය. පොහොර භාවිතය ඉහළයාම ද පොල් නිෂ්පාදනය වැඩිවීමට දායක විය.

කුරුඳු, කරාබු නැට්, ගම්මිරිස්, වසාවාසි, කෝපි, කොකෝවා සහ පුවක් වැනි අනිකුත් කෘෂිකාර්මික අපනයන බෝග නිෂ්පාදනය 2006 දී මිශ්‍ර ප්‍රගතියක් පෙන්වීය. කුරුඳු, කජුමද සහ ගම්මිරිස් නිෂ්පාදනය පිළිවෙලින් සියයට 3.7, සියයට 7.3 සහ සියයට 1.2 කින් වැඩිවූ අතර, එයට හේතු වූයේ නැවත වගාකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ඵලදායීතාව වර්ධනය කිරීමත්, වැඩිදියුණුකළ තාක්ෂණය සහ වගා

2.3 සංඛ්‍යා සටහන **ප්‍රධාන කෘෂි බෝගවල උපනතීන්**

	අයිතමය	ඒකකය	2005(අ)	2006(අා)
1.	තේ			
1.1	නිෂ්පාදනය (ඇ)	කි.ග්‍රෑම් දශ ලක්ෂ	317.2	310.8
1.2	මුළු වගා බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	222.0	222
1.3	දළු කැඩීම සිදුකරන ලද බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	193	193
1.4	නිෂ්පාදන පිරිවැය (ඈ)	රු./කි.ග්‍රෑම්	168.41	187.67
1.5	සාමාන්‍ය මිල			
	- කොළඹ වෙන්දේසිය	රු./කි.ග්‍රෑම්	185.84	198.87
	- අපනයන (නැ.වි.ස.)	රු./කි.ග්‍රෑම්	263.81	279.97
1.6	නැවත වගා කිරීම	හෙක්ටයාර	1,351	1,338
1.7	අළුතින් වගා කිරීම	හෙක්ටයාර	7	10
1.8	එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ)		1.9	1.8
2.	රබර්			
2.1	නිෂ්පාදනය	කි.ග්‍රෑම් දශ ලක්ෂ	104.4	109.2
2.2	මුළු වගා බිම් ප්‍රමාණය (ඊ)	හෙක්ටයාර දහස්	116	118
2.3	කිරි කපන ලද බිම් ප්‍රමාණය (ඊ)	හෙක්ටයාර දහස්	91	95
2.4	නිෂ්පාදන පිරිවැය	රු./කි.ග්‍රෑම්	76.12	77.38
2.5	සාමාන්‍ය මිල			
	- කොළඹ වෙන්දේසිය (ආර්.එස්.එස්.නො.1)	රු./කි.ග්‍රෑම්	147.41	187.97
	- අපනයන (නැ.වි.ස.)	රු./කි.ග්‍රෑම්	147.73	204.70
2.6	නැවත වගා කිරීම (උ)	හෙක්ටයාර දහස්	1,257	1,122
2.7	අළුතින් වගා කිරීම (උ)	හෙක්ටයාර දහස්	1,032	2,563
2.8	එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ)		0.7	0.9
3.	පොල්			
3.1	නිෂ්පාදනය	ගෙඩි දශ ලක්ෂ	2,515	2,684
3.2	මුළු වගා බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	395	395
3.3	නිෂ්පාදන පිරිවැය	ගෙඩියකට රුපියල්	7.50	8.00
3.4	සාමාන්‍ය මිල			
	- නිෂ්පාදන මිල (උආ)	ගෙඩියක් රුපියල්	12.46	10.86
	- අපනයන (නැ.වි.ස.) (උආ)	ගෙඩියක් රුපියල්	13.04	14.39
3.5	නැවත වගා කිරීම/ යටි වගාව (එ)	හෙක්ටයාර	1,668	997
3.6	අළුතින් වගා කිරීම (එ)	හෙක්ටයාර	3,250	4,102
3.7	එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ)		2.1	1.7

(අ) සංශෝධිත
(අා) තාවකාලික
(ඇ) හරිත තේ ඇතුළුව
(ඈ) අමු තේ දළු සැපයුම්කරුවන්ගේ ලාභාංශද ඇතුළත් වේ.
(ඉ) වගා කිරීම සහ සැකසුම් කටයුතු සිදු කළ ප්‍රමාණය පමණි.
(ඊ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2003 දී පවත්වන ලද කෘෂිකර්ම සංගණනය මත පදනම්ව රබර් වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය සංශෝධනය කර ඇත.
(උ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුව වගා කළ බිම් ප්‍රමාණය
(උආ) ප්‍රධාන පොල් නිෂ්පාදන තුන සඳහා පමණි.
(එ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම් ආවරණය වේ.

මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
වැවිලි සමාගම්
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

2.4 සංඛ්‍යා සටහන — **වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා**

අයිතමය	ඒකකය	2005 (අ)			2006 (ආ)		
		මහ	යල	එකතුව	මහ	යල	එකතුව
වපුරන ලද බීම ප්‍රමාණය දළ වශයෙන්	හෙක්ටයාර දහස්	581	357	937	591	319	910
අස්වැන්න නෙලා ගත් දළ බීම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	569	345	915	586	314	900
අස්වැන්න කපා ගන්නා ලද ශුද්ධ බීම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	508	310	818	525	283	808
නිෂ්පාදනය	මෙ.ටො.දහස්	2,012	1,233	3,246	2,136	1,206	3,342
	බුසල් දහස්	96,445	59,116	155,561	102,350	57,814	160,164
ඵලදාව (ඇ)	හෙක්ටයාරයට කි.ග්‍රෑම්	3,955	3,976	3,963	4,069	4,263	4,137
දෙන ලද ණය ප්‍රමාණය	රුපියල් දශ ලක්ෂ	833	531	1,364	683	534	1,217
සහල් ආනයනය	මෙ.ටො.දහස්	-	-	52	-	-	12
සහල් ආනයනයට සමාන වී ප්‍රමාණය	මෙ.ටො.දහස්	-	-	76	-	-	18

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් රැස්කළ දත්ත පදනම් කොට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සකස් කරන ලද සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක ඵලදාව ගණනය කර ඇත. මුළු නිෂ්පාදනය අස්වැන්න නෙලා ගත්තා ලද ශුද්ධ බීම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කෙරේ.

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය යොදාගැනීම සහ ගොවි පුහුණු වැඩසටහන් පැවැත්වීමත්ය. යෙදවුම් මිල ඉහළයාම නිසා වල් නාශක කටයුතු සහ පොහොර භාවිතය වැනි කෘෂි කළමනාකරණ කටයුතු දුර්වල විය.

දේශීය කෘෂිකර්මය

2006 යල කන්නයේ වී නිෂ්පාදනය අඩුවීමක් සිදුවුවද, මෙතෙක් වාර්තා වූ ඉහළම වී නිෂ්පාදනය වන මෙට්‍රික් ටොන් 3,342,000 (සියයට 2.9 ක වර්ධනයක්) 2006 දී වාර්තා විය. කාලගුණ තත්ත්වය යහපත්වීම, පොහොර භාවිතය ඉහළයාම සහ ඉහළ මිල ගණන් මෙම වැඩිවීමට හේතු විය. 2005/06 මහ කන්නයේ වී නිෂ්පාදනය සියයට 6.1 කින් වැඩිවූ අතර යල කන්නයේ අස්වැන්න සියයට 2.2 කින් අඩුවිය. මෝසම් වැසි ප්‍රමාදවීම යල කන්නයේ වී නිෂ්පාදනය අඩු වීමට හේතු විය.

2006 දී දේශීය සීනි නිෂ්පාදනය යථාතත්ත්වයට පත්විය. සීනි පදනම් කරගත් ජීව ඉන්ධන නිෂ්පාදනය වැඩිවීම හේතුකොටගෙන ජාත්‍යන්තර වෙළෙඳපොළේ සීනි මිල ඉහළයාම දේශීය සීනි නිෂ්පානය තවදුරටත් දිරි ගැන්වීය.

වන සංරක්ෂණ

වන සංරක්ෂණ අංශයේ ප්‍රධාන සැලැස්මට අනුව වන සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා 2006 දී පියවර කිහිපයක් ගන්නා ලදී. ආසියානු සංවර්ධන බැංකුවේ ණය පහසුකම් මගින් මූල්‍යනය කෙරෙන වන සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ, වන වගාව සංවර්ධනය සඳහා වැඩුණු තේක්ක සහ යුකලිප්ටස් වගා ඉවත්කර හෙක්ටයාර් 1,843 ක වන වගාවන් ප්‍රතිසංස්කරණය කරන ලද අතර, හෙක්ටයාර් 1,254 ක් අළුතින් වගාකරන ලදී. 2006 දී, ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් විසින් හෙක්ටයාර් 22,300 ක ප්‍රයෝජනයට නොගත් බීම් ප්‍රමාණයකද වන වගාව සිදුකර ඇත.

ධීවර

ධීවර කර්මාන්තය ශක්තිමත් ලෙස යථාතත්ත්වයට පත්වීම පෙන්නුම් කරමින් 2006 වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 251 දක්වා සියයට 54 කින් වැඩිවිය. මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය සහ මිරිදිය සහ ජලජීවී මත්ස්‍ය නිෂ්පාදනය යන උප අංග දෙකම පිළිවෙලින් සියයට 65.6 කින් සහ සියයට 7.5 කින් වැඩිවිය. කෙසේ වුවත්, ආරක්ෂක හේතු මත සමහර වෙරළබඩ ප්‍රදේශවල මුහුදු ධීවර කටයුතුවල සීමාවන් පැවතුණි. 2007 දී මත්ස්‍ය නිෂ්පාදනය සුනාමියට පෙර පැවති නිෂ්පාදන

2.5 සංඛ්‍යා සටහන — **පශු සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යා**

	උප අංශය	2005	2006(අ)
1.	ජාතික ගවයන් සංඛ්‍යාව (දශ ලක්ෂ)	1.5	1.5
	එළ ගවයන්	1.2	1.2
	මී ගවයන්	0.3	0.3
2.	ජාතික කිරි නිෂ්පාදනය (ලීටර් දශ ලක්ෂ)	192.7	196.6
	එළ කිරි	162	165
	මී කිරි	31	32
3.	කිරි ආහාර නිෂ්පාදනය (ලීටර් දශ ලක්ෂ)	6.8	8.6
4.	නිෂ්පාදන මිල - එළකිරි (රු./ලීටර්)	20.55	21.00
5.	ජාතික බිත්තර නිෂ්පාදනය	865	901
6.	ජාතික කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටො.දහස්)	97.3	78.8

(අ) තාවකාලික

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
කෘෂිකර්ම සහ පශු සම්පත් අමාත්‍යාංශය

2.6 සංඛ්‍යා සටහන **මත්ස්‍ය නිෂ්පාදනය**

මෙට්‍රික් ටොන් දහස්

උප අංශය	2005(අ)	2006(ආ)
මුහුදු මත්ස්‍ය (ඇ)	130	216
ජල ජීවී සහ මිරිදිය මසුන්	33	35
එකතුව	163	251

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුහුදු බඩ සහ ගැඹුරු මුහුදු ධීවර අංශයන්

මූලයන් : ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
ජාතික ජල සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනය

මට්ටම් අභිබවා කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 300 ක පමණ මුළු මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා දෙමින් ධීවර කර්මාන්තය සම්පූර්ණයෙන් යථාතත්ත්වයට පත්වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කාර්මික

පතල් හා කැනීම්, නිමැවුම් කර්මාන්ත, විදුලිය හා ජලය සහ ඉදිකිරීම් යන අංශවලින් සමන්විත කාර්මික අංශය 2006 දී සියයට 7.2 කින් (2005 දී සියයට 8.3 කි) වර්ධනය විය. සමස්ත ද.දේ.නි. යට කාර්මික අංශයෙහි දායකත්වය සියයට 27 ක් ව නොවෙනස් ව පැවතුණි. කාර්මික අංශය තුළ විශාලතම අංශය වූ නිමැවුම් කර්මාන්ත අංශයෙහි දායකත්වය සියයට 16 දක්වා (2005 දී සියයට 16.3 කි) පහත වැටුණි.

2005 දී සියයට 6.2 කින් වර්ධනය වූ කම්හල් කර්මාන්ත 2006 දී තවදුරටත් සියයට 5.9 කින් වර්ධනය විය. තෙල් මිල උච්චාවචනයන්, ඇඟලුම් කර්මාන්තය තුළ පැවැති දැඩි ගෝලීය තරඟකාරිත්වය සහ ආරක්ෂක හේතු මත උතුරු හා නැගෙනහිර ආර්ථික කටයුතු අඩාලවීම යනාදී අභියෝගයන් මධ්‍යයේ මෙම වර්ධනය ළඟාකර ගැනීමට සමත්විය. අපනයන මෙන්ම දේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්ත දෙවර්ගයම මෙම වර්ධනයට දායක විය. 2006 වසරේ දී කම්හල් කර්මාන්ත අංශයේ නිපැයුමෙන් සියයට 96 කට දායක වූ පෞද්ගලික අංශයේ කර්මාන්ත, සියයට 5.8 කින් වර්ධනය වූ අතර, රාජ්‍ය අංශයේ කර්මාන්ත සියයට 7.6 කින් වර්ධනය විය. පෞද්ගලික කර්මාන්ත අංශයේ, ආයෝජන මණ්ඩලයට අයත් හා එයට අයත් නොවන කර්මාන්ත පිළිවෙලින් සියයට 5.9 කින් හා සියයට 5.6 කින් වර්ධනය වූ අතර සමස්ත කම්හල් කර්මාන්ත නිෂ්පාදනයට වූ දායකත්වය පිළිවෙලින් සියයට 55 ක් හා සියයට 45 ක් විය.

කර්මාන්ත නිෂ්පාදන කාණ්ඩ 9 අතුරින් ප්‍රධාන වශයෙන් කර්මාන්ත කාණ්ඩ හතරක නිමවුම් වර්ධනය වේගවත් වූ අතර, ඒවා අතර ආහාර, පානවර්ග හා දුම්කොළ නිෂ්පාදිත, රෙදිපිළි, ඇඟලුම් හා සම් භාණ්ඩ නිෂ්පාදිත, රසායනික ද්‍රව්‍ය, රබර්, ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් නිෂ්පාදිත හා ලෝහ නොවන ඛනිජමය නිෂ්පාදිතයන් විය. 2006 දී කාර්මික අංශයේ වර්ධනය සඳහා මෙම කාණ්ඩයන්හි දායකත්වය සියයට 90 ක් විය.

අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලැබුවේ රෙදිපිළි හා ඇඟලුම්, රබර් අත්වැසුම් හා ටයර්, සකස් කළ දියමන්ති, මැණික් හා ස්වර්ණාභරණ, පිඟන් නිෂ්පාදිත, ප්ලාස්ටික් නිෂ්පාදිත සහ ඛනිජ තෙල් නිෂ්පාදිත හා අදාළ කර්මාන්තයන්ය. වේගවත් ගෝලීය ආර්ථික වර්ධනය, නිදහස් වෙළෙඳ ගිවිසුම් යටතේ ඉන්දියාව, පකිස්තානය වැනි කලාපීය රටවල් සමග වෙළෙඳ කටයුතු පුළුල්වීම, යුරෝපය, ආසියානු - පැසිපික් හා සාක් කලාප තුළ විශේෂ ලාභදායක වෙළෙඳ පොළවලට ප්‍රවේශවීම හා ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපා වෙළෙඳපොළවල ඉල්ලුම ඉහළයාම තුළින් මෙම කර්මාන්ත වාසි ලැබූහ. දේශීය උද්ධමනය සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතිය ද රුපියලේ අගය අවප්‍රමාණය වීම, ඵලදායීතා වර්ධනය සහ වර්ධනය වූ අලෙවිකරණ හැකියාව ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ අපනයන තරඟකාරිත්වය පවත්වාගෙන යාම සඳහා උපකාරී විය.

කාර්මික නිෂ්පාදන අතර දේශීය වෙළෙඳපොළ යොමුකරගත් කර්මාන්ත පුළුල් පරාසයක පැතිරුණි. සිමෙන්ති, ගොඩනැගිලිද්‍රව්‍ය, පිඟන්, ආහාර, පානවර්ග, රසායනික ද්‍රව්‍ය හා පොහොර මීට අයත් විය. වැය කළහැකි ආදායම වැඩිවීම, ඉදිකිරීම් අංශයේ වර්ධනය සහ මාර්ග, මහා මාර්ග, විදුලි සංදේශ හා වරාය වැනි අංශවල යටිතල පහසුකම් වර්ධනයවීම හේතුකොටගෙන ඉහත නිෂ්පාදන සඳහා පැවති ඉල්ලුම වැඩිවිය. "නිපැයුම් ශ්‍රී ලංකා" කර්මාන්ත 300 වැඩසටහන යටතේ නව කර්මාන්ත පිහිටුවීම, කර්මාන්ත නැවත ස්ථාපනය කිරීම, තුල්හිරිය රෙදිපිළි සංකීර්ණය සංවර්ධනය කිරීම සහ "ගමට කර්මාන්ත" වැඩසටහන තුළින් වූ අභිවෘද්ධිය හේතුවෙන් තවදුරටත් අනාගතයේ දී දේශීය

2.7 සංඛ්‍යා සටහන **කාර්මික නිෂ්පාදන වටිනාකම (1990 ස්ථාවර මිල අනුව)**

	කාණ්ඩය	රු. දශ ලක්ෂ		ප්‍රතිශත වෙනස	
		2005	2006 (අ)	2005	2006 (අ)
1	ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත	55,430	58,756	4.8	6.0
2	රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදිත	97,576	101,772	4.9	4.3
3	දැව හා දැව නිෂ්පාදිත	1,659	1,709	3.1	3.0
4	කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත	4,000	4,136	3.0	3.4
5	රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත	50,720	54,930	12.5	8.3
6	ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත	19,777	21,933	6.2	10.9
7	මූලික ලෝහ නිෂ්පාදිත	2,600	2,759	5.9	6.1
8	සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ	10,825	11,161	3.0	3.1
9	කාර්මික නිෂ්පාදිත (අන් කැතක සඳහන් නොවූ)	5,366	5,548	3.1	3.4
	එකතුව	247,953	262,704	6.2	5.9

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

2.3 රූප සටහන කාර්මික නිමැවුමෙහි සංයුතිය - 2006



වෙළෙඳපොළ යොමුකරගත් කර්මාන්තවල නිෂ්පාදන ධාරිතාව පුළුල් වේ යැයි බලාපොරොත්තු වේ.

රෙදිපිළි, ඇඟළුම් හා සම් භාණ්ඩ නිෂ්පාදිත කාණ්ඩයේ 2005 දී වාර්තා කළ සියයට 4.9 ක වර්ධනයට සාපේක්ෂව, 2006 දී සියයට 4.3 කින් වර්ධනය විය. 2006 වසරේ සමස්ත කම්හල් කර්මාන්ත වර්ධනය සඳහා මෙම උප කාණ්ඩයේ දායකත්වය සියයට 39 කි. චීනය, ඉන්දියාව, වියට්නාමය, බංග්ලාදේශය හා පකිස්තානය වැනි අඩු පිරිවැයක් සහිත භාණ්ඩ නිෂ්පාදනය කරන රටවල් වලින් වූ තරගකාරිත්වය වැඩිවීම නිසා ඇමෙරිකා එක්සත් ජනපද වෙළෙඳපොළ වෙත සිදුකළ ඇඟළුම් අපනයන ප්‍රමාණය අඩුවීම මෙම මන්දගාමී වර්ධනයට ප්‍රධාන හේතුවක් විය. කෙසේ වුවත්, වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය යටතේ ලද තීරු බදු සහන නිසා යුරෝපා වෙළෙඳපොළ තුළ ඉහළ අපනයන වර්ධනයක් අත්කරගැනීම හේතුවෙන් මෙහි බලපෑම තරමක් දුරට සමනය විය. 2006 දී යුරෝපා වෙළෙඳපොළට වූ අපනයන සියයට 21.4 කින් වර්ධනය විය. කෙසේ වුවත්, ඇඟළුම් නිෂ්පාදන සඳහා අවම වශයෙන් සියයට 50 ක දේශීයව වටිනාකමක් එකතු කළ යුතු යැයි සඳහන් දැඩි ප්‍රභවස්ථාන නිර්ණායක හේතුකොට, ඉහත ප්‍රතිලාභ පූර්ණව භුක්ති විඳීමට හැකියාව ලැබී නොමැත. නිෂ්පාදන විශේෂීකරණය, අනෙකුත් ව්‍යාපාර සමග බද්ධවීම හා ව්‍යාපාර අත්පත් කරගැනීම්, කර්මාන්තවල ඉදිරිපස හා පසුපස බැඳීම් ප්‍රවර්ධනය වීම, නිෂ්පාදනවල ගුණාත්මක භාවය ඉහළයාම හා වෙළෙඳපොළ හැකියාව වර්ධනය වීම තුළින් ඇඟළුම් අංශයේ ඇතැම් නිෂ්පාදකයින්ට තම හැකියාවන් වර්ධනය කරගැනීමට හැකිවී ඇත. වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය යටතේ ලැබුණ සහන නිසා 2006 දී සම්භාණ්ඩ කර්මාන්ත අංශය ද මනා ප්‍රගතියක් දැක්වීය.

විශේෂයෙන්ම දේශීය වෙළෙඳපොළ සැපයුම අරමුණු කරගත් ආහාර, පානවර්ග සහ දුම්කොළ නිෂ්පාදන 2006 දී සියයට 6.0 ක වර්ධනයක් සමග සමස්ත වර්ධනයට සියයට 22 ක දායකත්වයක් ලබා දුන්නේය. සැකසූ ආහාර, පානවර්ග, මධ්‍යසාර, අයිස්ක්‍රීම්, බිස්කට්, කිරි නිෂ්පාදිත, පානීය ජලය, පලතුරු, එළවළු සහ ටින්කළ නිෂ්පාදිතයන්ගේ වර්ධනය මෙම ක්‍රියාකාරිත්වයට හේතු විය. යුරෝපයෙන් එළවළු සහ පලතුරු සඳහාත් මැද පෙරදිග හා කලාපීය රටවලින් බිස්කට් සඳහාත් වූ ඉල්ලුම වැඩිවීම මෙම කර්මාන්තයන්හි වර්ධනයට දායක විය. කෙසේ වුවත්, සෞඛ්‍යය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මකවීම සහ දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මකවීම නිසා දුම්කොළ නිෂ්පාදනයේ නිමැවුම පහළ වැටීමට හේතු විය.

2006 දී රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදන කාණ්ඩයේ නිමැවුම සියයට 8.3 කින් ඉහළ ගියේය. මෙම අංශයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායකත්වය සැපයුවේ රබර්

2.8 සංඛ්‍යා සටහන ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුම් ලාභය(අ)

කාණ්ඩය	මුළු නිෂ්පාදන පිරිවැය (රු. දශ ලක්ෂ)		මුළු නිෂ්පාදන වටිනාකම (රු. දශ ලක්ෂ)		කම්හල් ලාභ අනුපාත (ප්‍රතිශතය)	
	2005(ආ)	2006(ඇ)	2005(ආ)	2006(ඇ)	2005(ආ)	2006(ඇ)
1 ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත	85,934	94,086	100,615	110,365	14.6	14.8
2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත	22,546	23,532	25,734	26,942	12.4	12.7
3 දැව හා දැව නිෂ්පාදිත	1,689	1,813	1,913	2,050	11.7	11.6
4 කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත	5,107	5,721	5,820	6,544	12.3	12.6
5 රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත	36,075	42,160	42,625	49,965	15.4	15.6
6 ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත	22,005	25,167	25,952	29,878	15.2	15.8
7 මූලික ලෝහ නිෂ්පාදිත	2,461	2,832	2,865	3,305	14.1	14.3
8 සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ	13,74	15,258	15,933	17,679	13.4	13.7
9 කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ)	3,356	3,630	3,792	4,113	11.5	11.7
එකතුව	**192,967**	**214,199**	**225,249**	**250,841**	**14.3**	**14.6**

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 510 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

2.9 සංඛ්‍යා සටහන ආයෝජන මණ්ඩලයට අයත් යටත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල දේශීය පිරිවැය ව්‍යුහය[අ] (මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස)

	කාණ්ඩය	දේශීය පිරිවැය (ප්‍රතිශතයන්)							
		බලය සහ ඉන්ධන		වැටුප්		අමුද්‍රව්‍ය		පොලිය	
		2005	2006	2005	2006	2005	2006	2005	2006
1	ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත	3.2	3.4	10.2	10.1	39.8	39.7	1.1	1.3
2	රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදිත	4.4	4.5	15.1	15.2	13.0	13.1	2.2	2.3
3	දැව හා දැව නිෂ්පාදිත	9.2	9.1	16.4	16.1	32.8	33.2	4.2	4.1
4	කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත	3.9	4.1	13.1	13.2	19.1	19.5	3.6	3.4
5	රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත	6.0	6.4	13.0	13.3	29.8	30.4	3.4	3.5
6	ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත	19.3	19.9	14.9	14.9	28.9	29.2	2.9	3.2
7	මූලික ලෝහ නිෂ්පාදිත	9.7	9.9	11.2	11.3	35.8	35.9	2.5	2.5
8	සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ	4.9	5.0	12.1	12.2	27.0	26.9	3.9	4.0
9	කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ)	5.3	5.2	11.9	12.0	34.8	34.6	1.5	1.4
එකතුව		**6.0**	**6.3**	**12.0**	**12.3**	**31.4**	**32.1**	**2.2**	**2.3**

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 510 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත. මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ආශ්‍රිත නිෂ්පාදිත, ප්ලාස්ටික් හා පී.වී.සී නිෂ්පාදිත, රසායනික ද්‍රව්‍ය සහ ඛනිජ තෙල් නිෂ්පාදිත යන කාණ්ඩයන්ය. ඉදිකිරීම් අංශයේ ඇතිවූ සීඝ්‍ර වර්ධනය හේතුකොටගෙන ප්ලාස්ටික් හා පී.වී.සී. නිෂ්පාදනයේ නිමැවුම සියයට 11.5 කින් වැඩිවිය. 2005 දී අත්කරගත් සියයට 25 ක වර්ධනයට සාපේක්ෂව, 2006 දී රබර් ආශ්‍රිත නිෂ්පාදිතය සියයට 10.4 කින් වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ 2006 දී ඇමෙරිකා එක්සත් ජනපදයට අපනයන කළ ටයර් ප්‍රමාණය අඩුවීමයි. එසේ වුවත් දේශීය වෙළෙඳපොළේ රබර් ආශ්‍රිත නිෂ්පාදිත සඳහා වූ ඉල්ලුම වැඩිවිය.

ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදනයේ නිමැවුම 2006 දී සියයට 10.9 කින් වැඩිවිය. මෙම ඉහළයාම සිමෙන්ති, පිඟන්, ගොඩනැගිලි ද්‍රව්‍ය හා සකස් කළ දියමන්ති යන උප කාණ්ඩයන් මගින් මෙහෙය විය. ඉදිකිරීම් අංශයේ සිදු වූ වේගවත් දියුණුව සහ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතින් නිසා සිමෙන්ති, පිඟන් හා ගොඩනැගිලි ද්‍රව්‍ය වැඩි වේගයකින් වර්ධනය විය. ඉහළ යන දේශීය වෙළෙඳපොළ ඉල්ලුමට මුහුණදිය හැකි වන සේ සිමෙන්ති හා ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනයේ ප්‍රමුඛයන් තම ධාරිතාවයන් පුළුල් කර ගෙන ඇත. වීදුරු බෝතල් නිෂ්පාදන කර්මාන්ත ද සහ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත ද තම ධාරිතාව පුළුල් කළ අතර, අපනයන වෙළෙඳපොළ වෙත යොමු වූ විශේෂ අයිතමයන් නිෂ්පාදනය කළේය.

2006 දී සකස් කළ ලෝහ නිෂ්පාදිත සියයට 3.1 කින් වර්ධනය විය. දේශීය ඉල්ලුම අඛණ්ඩව වැඩිවූ අතර මැද පෙරදිග රටවල ඉල්ලුම වැඩිවීමත් සමග අපනයනය ද විශාල වශයෙන් වැඩිවිය.

2006 දී රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිමැවුම සියයට 7.6 කින් වර්ධනය විය. සමස්ත රාජ්‍ය අංශයේ නිමැවුමෙන් සියයට 90 ක් සඳහා දායක වූ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මෙම වර්ධනයට මූලික විය. මෙම සංස්ථාවේ නිමැවුම 2006 දී සියයට 7.8 කින් ඉහළ ගියේය. සෙවනගල සීනි කර්මාන්ත ආයතනයේ හා සීමාසහිත ලංකා ලුණු සමාගමවල නිමැවුම 2006 දී පිළිවෙලින් සියයට 27.4 ක් හා සියයට 20.6 කින් ඉහළ ගියේය.

2006 දී ආයෝජන මණ්ඩලයට අයත් නොවන ආයතන මූලික කරගත් සමීක්ෂණයට අනුව, මුළු නිෂ්පාදන පිරිවැයෙන්, කම්හලෙන් පිටවන නිෂ්පාදනයේ වටිනාකම ලෙස ඇස්තමේන්තු කළ, කම්හල් කර්මාන්තයේ ලාභ අනුපාතය සියයට 14.6 ක් වූ අතර, එය 2005 වසරට වඩා සියයට 2.1 ක වර්ධනයකි. දේශීය අලෙවිය ඉහළයාම, කාර්යක්ෂම ලෙස අමුද්‍රව්‍ය භාවිතය, පොදු කාර්ය පිරිවැය මනා ලෙස කළමනාකරණය කිරීම, නව තාක්ෂණයට අනුගත වීම, නාස්තිය අවමකිරීම, ශ්‍රම ඵලදායීතාවය වැඩිකිරීම, කාරක ප්‍රාග්ධනය මනා ලෙස

2.10 සංඛ්‍යා සටහන ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල ශ්‍රම ඵලදායීතා දර්ශකය[අ]

1995=100

	කාණ්ඩය	2005	2006	ප්‍රතිශත වෙනස
1	ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත	132.5	135.8	2.5
2	රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදිත	113.2	117.3	3.6
3	දැව හා දැව නිෂ්පාදිත	103.1	105.5	2.4
4	කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත	103.7	106.3	2.5
5	රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත	139.5	144.8	3.8
6	ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත	114.5	117.4	2.6
7	මූලික ලෝහ නිෂ්පාදිත	103.0	105.3	2.3
8	සකස්කළ ලෝහ නිෂ්පාදික, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ	123.8	127.5	3.0
9	කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ)	110.7	113.7	2.7
එකතුව		**119.7**	**123.5**	**3.2**

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 510 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත. මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

කළමනාකරණය, මිනිස් ශ්‍රමය වඩාත් ඵලදායී ලෙස යොදා ගැනීම, ලාභ නොලබන ඒකකයන් වසා දැමීම සහ ඵලදායී ලෙස මිල ගැලපීමේ ප්‍රතිපත්තිවලට අනුගතවීම යනාදිය ආයතනවල ලාභදායිත්වය පවත්වාගෙනයාම සඳහා උපකාරී විය. තොරතුරු තාක්ෂණය මනා ලෙස උපයෝගී කරගැනීම නිසා උපාය මාර්ගික තීරණ ගැනීමේ හැකියාව වැඩිකිරීමට සහ අලෙවිකරණයට උපකාරී වූ අතර එය ඉහළ පිරිවැය කාර්යක්ෂමතාවයක් ලබාගැනීමට ද උපකාරී විය. 2006 වසර තුළ ආයතනවල නිෂ්පාදන පිරිවැය ඉහළයාමට, බලශක්ති සහ ආනයනික අමුද්‍රව්‍යවල පිරිවැය වැඩිවීම හේතු විය. කෙසේ වෙතත්, මෙම නිෂ්පාදන පිරිවැය වැඩිවීම, විකල්ප බලශක්ති මූලාශ්‍ර උපයෝජනය හරහා අවම කර ගෙන ඇත.

2006 දී කම්හල් කර්මාන්තයේ වැටුප් පිරිවැය සියයට 17.4 කින් වැඩිවූ අතර, එය මුළු නිෂ්පාදන පිරිවැයට වූ දායකත්වය සැලකූ විට සියයට 12 සිට සියයට 12.3 දක්වා වැඩි විය. වසර තුළ නිෂ්පාදන පිරිවැය මත, ඉහළ උද්ධමනයේ හා උද්ධමන අපේක්ෂා බලපෑම පිළිබිඹු කරමින් වැටුප්, දිරිදීමනා හා දීමනාවන් වැඩිවිය. ඉහළ යන වැටුප් වියදම පාලනය කිරීම සඳහා ආයතන විසින් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. පවතින මිනිස් ශ්‍රමය ඵලදායී ලෙස උපයෝගී කරගැනීම, අතිකාල දීමනා තාර්කීකරණය කිරීම, ඵලදායිතා වර්ධනය, ඉහළ පිරිවැයක් ඇති ඒකක පිටතින් ලබාගත හැකි නම් එසේ ලබාගැනීම සහ අනියම් හා කොන්ත්‍රාත් පදනමින් සේවකයින් බඳවාගැනීම මින් සමහරක් වේ. ණයගැනීමේ පිරිවැය අඛණ්ඩව ඉහළයාම නිසා මුළු නිෂ්පාදන පිරිවැයේ ප්‍රතිශතයක් ලෙස, ණය පොළී වියදම ද සුළු වශයෙන් වැඩිවී ඇත.

වසරේ දෙවන අර්ධයේ කාලගුණික තත්ත්වය සහ වෘත්තිය සංගම් ක්‍රියාමාර්ග වල අයහපත් බලපෑම නිසා විශේෂයෙන්ම තේ නිෂ්පාදනය පහත වැටීම හේතුකොටගෙන, වැවිලි බෝග සැකසීම් උප අංශයේ එකතු කළ අගය ආන්තික වශයෙන් සියයට 1.1 කින් පමණක් වර්ධනය විය. පොල් නිෂ්පාදනය ඉහළයාමත්, දේශීය හා විදේශීය වෙළෙඳපොළ දෙකෙහිම ඉහළ මිලකින් රබර් සඳහා ඉල්ලුම වැඩිවීමත් සමග රබර් නිපැයුම වැඩිවීමත් මෙම උප අංශයේ වර්ධනයට හේතු විය.

2005 වසරේදී සියයට 9.8 ක සිත් ගන්නා සුළු ප්‍රසාරණයක් වාර්තා කළ කුඩා කර්මාන්ත උප අංශයේ 2006 වසරේ වර්ධනය සියයට 5.3 ක මන්දගාමීත්වයක් දැක්වීය. ඉදිකිරීම් අංශයේ ප්‍රසාරණය මගින් දැව කර්මාන්තය, කළුගල් නිෂ්පාදනය සහ පිඟන් ගඩොල්, ගඩොල්, සිමෙන්ති ගල් සහ ඒ ආශ්‍රිත ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළේය. වැඩි වූ පාරිභෝගික ඉල්ලුමත් සමග ගෘහ භාණ්ඩ සහ වඩු කර්මාන්තය, බේකරි නිෂ්පාදන, ස්වර්ණාභරණ, නිමි ඇඳුම් සහ අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත, පාවහන් සහ අනෙකුත් පදම් කළ සම් නිෂ්පාදන වැනි කුඩා පරිමාණයේ කර්මාන්ත නිෂ්පාදනයන්හි එකතු කළ අගයේ දායකත්වයද වර්ධනය විය. කෘෂිකාර්මික නිෂ්පාදනයන්හි වර්ධනයත් සමඟ සහල් සැකසීම් සහ අනෙකුත් ඇඹරුම් කටයුතුද, පසුගිය වසරට වඩා අඩු වේගයකින් වුවත්, ප්‍රසාරණය විය.

2006 වර්ෂය තුළදී විදුලිය සහ ජලය අංශය නොකඩවා ප්‍රසාරණය විය. 2005 වසරේදී සියයට 24.5 කින් වර්ධනය වූ මෙම අංශය, මෙම වසරේදී සියයට 20.2 කින් තවදුරටත් ප්‍රසාරණය විය. වර්ෂය තුළදී, එකතු කළ අගය සියයට 22.2 කින් වර්ධනය වූ විදුලිය උප අංශය, සමස්ත අංශයේ ඉහළ වර්ධනයට ගාමකත්වය සැපයීය. වර්ෂය තුළ දී විදුලිය ගාස්තු දෙවතාවක් ඉහළ දැමීමට ප්‍රතිවිරුද්ධ ලෙස ගෘහස්ථ, කාර්මික හා වාණිජ සහ අනෙකුත් අංශයන්හි විදුලිය සඳහා ඉල්ලුම සියයට 7.3 කින් වර්ධනය විය. 2006 දී ජල විදුලි උත්පාදනය සියයට 34.5 කින් වර්ධනය වූ අතර, තාප විදුලි උත්පාදනය පහත වැටුණි. ජලාධාර ප්‍රදේශ වල පැවති යහපත් කාලගුණික තත්ත්වයන් නිසා ජල විදුලි උත්පාදනය ඉහළයාම හේතුවෙන් තාප විදුලි බල අවශ්‍යතාව යම්තාක් දුරට අවම කරනු ලැබිය. මුළු විදුලි බල උත්පාදනයෙන්, 2005 වසරේදී සියයට 39.4 ක් වූ ජල විදුලි උත්පාදනය 2006 දී සියයට 49.5 දක්වා වර්ධනය විය. නල ජලය රැස්කිරීම, පවිත්‍රීකරණය සහ බෙදාහැරීම අඩංගු ජලය උප කාණ්ඩ ද සියයට 4.2 ක (2005 දී සියයට 3.8 කි) වර්ධනයක් වාර්තා කළේය. මූලික අවශ්‍යතාවයක් වන ජලය, මහජනයාට සපයාදීමේ විවිධ ව්‍යාපෘති වර්ෂය තුළ ක්‍රියාත්මක වීම මෙම වර්ධනය කෙරෙහි දායක විය.

වර්ෂය තුළදී ඉදිකිරීම් කටයුතු වල වූ ප්‍රසාරණයට අනුකූලව පතල් සහ කැණීම් අංශය මූර්ත වශයෙන් සියයට 8.0 කින් (2005 දී සියයට 14.1 කි) **වර්ධනය විය.** පතල් උප අංශය 2006 දී සියයට 8.1 ක වර්ධනයක් වාර්තා කළේය. වසරේ අග භාගයේ දී මැණික් අපනයනයන්හි වර්ධනය, මෙම උප අංශයේ වර්ධනයට දායක විය. වසර තුළදී පතල් කටයුතු වලට සම්බන්ධ ඛනිජ වැලි සහ පොස්පේට් නිෂ්පාදනය පහත වැටුණු නමුත් දෙවන අර්ධය තුළදී මිනිරන් නිෂ්පාදන ප්‍රමාණය ඉහළ ගියේය.

ඉදිකිරීම් අංශය 2005 වසරේ සියයට 8.9 ක ඉහළ වර්ධනයට සාපේක්ෂව 2006 වසර තුළදී සියයට 8.0 ක වර්ධනයක් වාර්තා කළේය. විශේෂයෙන්ම නිවාස ව්‍යාපෘති වැනි සුනාමි ආශ්‍රිත ඉදිකිරීම් කටයුතු නොකඩවා 2006 වසර තුලද සිදු කෙරුනු නමුත්, කඩිනමින් නිම කළ යුතු ඉදිකිරීම් 2005 වසර තුළදී ක්‍රියාත්මක කළ බැවින්, සාපේක්ෂ වශයෙන් 2006 වසරේදී සුනාමි ඉදිකිරීම් වල අඩු වර්ධන ගාමකත්වයක් පැවතුනි. ව්‍යාපෘති විදේශාධාර වලින් සැලකිය යුතු කොටසක් මහා මාර්ග ජාලය සංවර්ධනය කිරීම ආශ්‍රිත ඉදිකිරීම් කටයුතු, විදුලිය අංශයේ වැඩි දියුණු කිරීම් සහ ජල සම්පාදන ව්‍යාපෘති සඳහා යොමු විය. දේශීය නිෂ්පාදිත සහ ආනයනික

ඉදිකිරීම් අමුද්‍රව්‍ය භාවිතයේ වර්ධනයද ඉදිකිරීම් අංශයේ ප්‍රසාරණය පිළිබිඹු කළේය. විශේෂයෙන්ම ඉදිකිරීම් අංශයේ ක්‍රියාකාරිත්වයේ ප්‍රධාන දර්ශකය වන සිමෙන්ති පරිභෝජනය 2006 වසර තුළදී ද සැලකිය යුතු මට්ටමකින් නොකඩවා වර්ධනය විය. නිවාස ඉදිකිරීමේ අරමුණු සඳහා බැංකු අංශයෙන් ලබාදුන් ණය වර්ධනය මගින්, වර්ෂය තුළදී නිවාස සහ සුබෝපභෝගී මහල් නිවාස ව්‍යාපෘති වැනි පෞද්ගලික අංශයේ ඉදිකිරීම් වල ප්‍රසාරණය පෙන්නුම් කෙරිණි. අමුද්‍රව්‍ය වල මිල සැලකිය යුතු ලෙස වැඩිවීම, කුඩා පරිමාණයේ ඉදිකිරීම් කටයුතු කෙරෙහි අයහපත් අන්දමින් බලපෑවේය. ඉදිකිරීම්, පුනුණු කිරීම් සහ සංවර්ධන ආයතනය (ICTAD) ප්‍රසිද්ධ කල මිල දර්ශකයන්ට අනුව ගොඩනැගිලි ද්‍රව්‍යයන්හි සමස්ත මිල වැඩිවීම, 2005 වසරේදී සියයට 14 ක වාර්ෂික වර්ධනයට සාපේක්ෂව 2006 වර්ෂයේ සියයට 19 ක් විය.

සේවා

පසුගිය වර්ෂයන්හි පරිදි, සේවා අංශය 2006 වර්ෂයේ ආර්ථික වර්ධනයට විශාල ප්‍රගමණයක් සැපයීය. සේවා අංශය සියයට 8.3 කින් වර්ධනය වූ අතර, සමස්ත ද.දේ.නි. යට සියයට 56.2 කට දායකත්වයක් සැපයීය. සේවා අංශයේ අඛණ්ඩ වර්ධන ක්‍රියාකාරිත්වයෙන් පිලිබිඹු වන්නේ ප්‍රධාන වශයෙන්ම රටතුළ සේවා සඳහා ඉහළ යමින් පවතින පාරිභෝගික ඉල්ලුමට ඇති ප්‍රතිචාරයයි. ආර්ථික සේවා, යටිතල පහසුකම් සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා සිදු කළ අඛණ්ඩ ආයෝජනයන්ද සේවා අංශය ආර්ථික වර්ධනයේ ප්‍රධාන කොටස්කරුවා ලෙස කැපී පෙනීමට මඟ පාදන ලදී.

තොග හා සිල්ලර වෙළෙඳාම සහ හෝටල් හා ආපන ශාලා අංශය සියයට 5.9 ක (2005 වර්ෂයේ සියයට 2.8 කි) වර්ධනයක් වාර්තා කිරීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආනයන වෙළෙඳ අංශයේ යහපත් ක්‍රියාකාරිත්වයයි. ආනයන වෙළෙඳ උප අංශය පසුගිය වර්ෂයේ වූ මන්දගාමී ක්‍රියාකාරිත්වයෙන් යථා තත්ත්වයට පත්වෙමින් සියයට 7.5 කින් වර්ධනය විය. ආනයන වෙළෙඳ උප අංශයේ වර්ධන ව්‍යුහය දේශීය ඉල්ලුමේ ප්‍රසාරණය පිලිබිඹු කරයි. පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමාව සියයට 10.0 කින් ඉහළ ගිය අතර, ආයෝජන භාණ්ඩ ආනයන සියයට 8.8 කින් පමණ ඉහළ ගියේය. පාරිභෝගික භාණ්ඩ අතුරින්, මූලික ආහාර ද්‍රව්‍ය වන තිරිඟු ඇට සහ සීනි ආනයනය වැනි දෑ ඉහළ ගිය අතර, සහල් ආනයනය 2006 වර්ෂයේ සරු අස්වැන්න හේතුකොටගෙන පහත වැටුණි. මෝටර් රථ සහ ගෘහස්ථ භාණ්ඩ වැනි වෙනත් පාරිභෝගික භාණ්ඩ ආනයනය සියයට 11.7 කින් වර්ධනය විය. ආයෝජන භාණ්ඩ කාණ්ඩය තුළ වන ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනයන් ඉදිකිරීම් අංශයේ වන ප්‍රසාරණය පිලිබිඹු කරමින් පසුගිය වර්ෂයේ ඉහළ පදනම් අගයට සාපේක්ෂව සියයට 3.4 කින් වර්ධනය විය. කෙසේ නමුත් පසුගිය වර්ෂයේ වූ සියයට 11.8 ක වර්ධනයට සාපේක්ෂව ප්‍රවාහන උපකරණ ආනයනය සියයට 2.6 කින් පහත වැටුණි. බොරතෙල්, වෙනත් ඛනිජ තෙල් ආශ්‍රිත ආනයන සහ දේශීය හා විදේශීය වෙළෙඳපොළට සැපයුම්කරනු ලබන කර්මාන්ත සඳහා වන අමුද්‍රව්‍ය ආනයනයන් වැඩිවීමත් සමඟ අන්තර් භාණ්ඩ ආනයන පරිමාවද සියයට 5.0 කින් වර්ධනය විය.

අපනයන වෙළෙඳ උප අංශය පසුගිය වර්ෂයේ වූ සියයට 6.9 ක වර්ධනයට සාපේක්ෂව 2006 වර්ෂය තුලදී සියයට 4.4. ක වර්ධනයක් වාර්තා කළේය. මෙම මන්දගාමීත්වයට අර්ධ වශයෙන් හේතු වූයේ කාර්මික අපනයන තුල වන, විශේෂයෙන්ම ආහාර, පාන වර්ග හා දුම්කොළ, රබර් නිෂ්පාදන වැනි දෑ අඩංගු වෙනත් කාර්මික අපනයන කාණ්ඩයේ අඩු වර්ධනයයි. කාර්මික අපනයන සඳහා ප්‍රධාන දායකත්වයක් සපයනු ලබන රෙදිපිළි හා ඇඟළුම් අපනයන සියයට 5.1 කින් වර්ධනය වූ අතර, ඛනිජ ආශ්‍රිත නිෂ්පාදන හා වෙනත් වර්ගයේ කාර්මික අපනයන පිළිවෙලින් සියයට 27.4 කින් හා සියයට 0.8 කින් වර්ධනය විය. ප්‍රධාන වතු වැවිලි බෝග තුනෙහිම ඉහළ අපනයනයන් සමග කෘෂිකාර්මික අපනයනයන් සියයට 5.6 කින් ඉහළ ගියේය. 2005 වර්ෂයේ වූ සියයට 17.5 ක පහත වැටීමකට සාපේක්ෂව මෙම වසර තුලදී රබර් අපනයන සියයට 42.8 කින් පමණ ඉහළ ගියේය. රබර් සඳහා ජාත්‍යන්තර මිල ගණන් සියයට 43 කින් පමණ ඉහළ යාමද අපනයනයන් දිරි ගැන්වීමට වීමට හේතු විය.

දේශීය වෙළෙඳ උප අංශය සියයට 4.5 කින් ප්‍රසාරණය වීමට මූලික වූයේ දේශීය කෘෂිකාර්මික හා කාර්මික යන අංශ දෙකෙහිම සතුටුදායක ක්‍රියාකාරිත්වයයි. වී නිෂ්පාදනය, ධීවර කටයුතු, කුඩා කර්මාන්ත හා දේශීය නිෂ්පාදන කර්මාන්ත මෙම වර්ධනයට වැඩි වශයෙන් දායක විය. කෙසේ නමුත්, මෑතකදී ආරක්ෂක උපාය මාර්ග ශක්තිමත් කිරීම දේශීය වෙළෙඳ කටයුතු වල ප්‍රසාරණය යම්තාක් දුරට අඩුවීමට හේතු විය.

සුනාමිය හේතුවෙන් පසුගිය වර්ෂයේ අඩු පදනම් අගයට සාපේක්ෂව, සංචාරකයින්ගේ පැමිණීම් සියයට 1.9 කින් වැඩි වීමත් සමඟ හෝටල් හා ආපන ශාලා උප අංශය සියයට 6.3 ක වර්ධනයක් වාර්තා කළේය. කෙසේ නමුත්, වර්ෂයේ දෙවන කාර්තුව තුලදී රට තුළ ආරක්ෂක ක්‍රියාමාර්ගයන්හි වූ වර්ධනය මෙම අංශයට අහිතකර බලපෑමක් ඇති කළේය. සුනාමි අලාභහානීවලින් සම්පූර්ණ යථා තත්ත්වයට පත්වී වසරේ පළමු අර්ධය තුළදී සියයට 20 කින් පමණ වර්ධනය වූ සංචාරක උප අංශය, වසරේ දෙවන අර්ධය තුලදී සියයට 5.8 කින් පහත වැටුණි. වසරේ අවසාන කාර්තුවේ අගනුවර සහ අනෙකුත් හෝටල්වල කාමර උපයෝජන අනුපාතය පහළ මට්ටමක වීම සංචාරක උප අංශයට තදින්ම බලපෑවේය. බටහිර යුරෝපයෙන් වූ සංචාරක පැමිණීම් සියයට 0.6 කින් පමණක් ඉහළ ගිය අතර, ආසියානු උප මහාද්වීපයෙන් වූ සංචාරකයින්ගේ පැමිණීම් තවදුරටත් සියයට 8.4 කින් ඉහළ ගියේය. සංචාරකයින්ගේ පැමිණීම

වර්ෂය තුළදී ආන්තිකව වැඩි වුවද, විදේශීය සංචාරකයින් හෝටල්වල ගතකළ රාත්‍රී සංඛ්‍යාව සියයට 15.4 කින් ඉහළ ගිය අතර, දේශීය සංචාරකයින් ගතකළ රාත්‍රී සංඛ්‍යාව ආන්තිකව පහත වැටුණි.

සේවා අංශය තුළ වූ ප්‍රවාහන, ගබඩා සහ සන්නිවේදන අංශය සියයට 13.1 කින් (2005 වර්ෂයේ සියයට 11.7 කි) ප්‍රසාරණය වීමට තැපැල් හා විදුලිසංදේශ උප අංශයේ වේගවත් ප්‍රසාරණය විශාල වශයෙන් හේතු විය. අඛණ්ඩව සහ වේගවත්ව වර්ධනය වූ මෙම උප අංශය තවදුරටත් සියයට 23 කින් ප්‍රසාරණය වීමට විශේෂයෙන්ම පුළුල් කලාප ජාලයන් (Broad Band Networks) සහ ආවරණයන් පුළුල් වීම යන විදුලි සංදේශ අංශයේ මෑත කාලීන වර්ධනයන් උපකාරී විය. විදුලි සංදේශ කර්මාන්තයෙහි ජංගම සහ ස්ථාවර දුරකථන සේවා සපයන සමාගම් සියයට 37 ක ආදායම වර්ධනයක් වාර්තා කරමින් වර්ෂය තුළ විශිෂ්ඨ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කර ඇත. සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ (CDMA) තාක්ෂණය සමග සපුරාලිය නොහැකි වූ දුරකථන සම්බන්ධතා සඳහා වූ පොරොත්තු ලේඛනය අවසන් කරමින් ස්ථීර දුරකථන ග්‍රාහක මට්ටම නව සම්බන්ධතා 651,681 ක් සමඟ සියයට 52 කින් පමණ වර්ෂය තුළදී ප්‍රසාරණය විය. මෑත කාලීනව සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ (CDMA) සහ ජංගම සන්නිවේදනය පිළිබඳ වන ගෝලීය පද්ධති (GSM) තාක්ෂණය ග්‍රාමීය ජනතාවට ඉතා ඉක්මණින් ස්ථීර දුරකථන සේවා ලබාගැනීම සඳහා ඉඩ සලසන ලදී. ජංගම දුරකථන ග්‍රාහක මට්ටම තවදුරටත් සියයට 61 කින් වර්ධනය වී, ජංගම දුරකථන ග්‍රාහක මට්ටම මිලියන 5.4 ක් ලෙස වාර්තා විය. මේ අතර, අන්තර්ජාල ප්‍රවේශයට ඉහළ ගුණාත්වයකින් හා වැඩි වේගයෙන් දත්ත සම්ප්‍රේෂණ හැකියාව ලබාදෙන යටිතල පහසුකම් සංවර්ධනය සමඟ අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් ග්‍රාහක මට්ටම සියයට 13 කින් වර්ධනය විය.

භාණ්ඩ මෙහෙයවීම් සහ ගබඩාකිරීම් උප අංශය වර්ෂය තුළදී සියයට 13.2 කින් ප්‍රසාරණය විය. ජයා බහාලුම් පර්යන්තය තුළ ජූලි මාසය තුළදී අකුරට වැඩ කිරීමේ ක්‍රියාමාර්ගයක් වෘත්තීය සමිති විසින් ගෙනයනු ලැබුවද, මෙහෙයවනු ලැබූ බහාලුම් සමඟම, ප්‍රති නැව්ගත කිරීම් කටයුතු සහ මුළු භාණ්ඩ පරිමා සැලකිය යුතු ලෙස වර්ධනය විය. ජාත්‍යන්තර නාවික සේවා සමාගම් කොළඹ වරාය හරහා නව සේවා ආරම්භ කිරීමද මෙම වර්ධනයට හේතු විය. 2006 වර්ෂය තුළදී කොළඹ වරාය සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සමාගමද ඇතුළුව අඩි විස්සේ සමාන බහාලුම් ඒකක මිලියන 3.08 ක් පමණ මෙහෙයවනු ලැබීය. සාමාන්‍යයෙන්, මෙහෙයවනු ලබන මුළු බහාලුම් ප්‍රමාණයෙන් තුනෙන් දෙකක් පමණ වන අන්තර් නැව් භාණ්ඩ පරිමාව සියයට 37 කින් පමණ ප්‍රසාරණය වූ අතර, දේශීය බහාලුම් පරිමාව ආන්තිකව ඉහළ ගියේය.

ප්‍රවාහන උප අංශය පසුගිය වර්ෂයේ වූ සියයට 3.3 ක වර්ධනයට සාපේක්ෂව සියයට 5.1 කින් පමණ ප්‍රසාරණය විය. භාණ්ඩ ප්‍රවාහන කටයුතු වල සියයට 5.3 ක වර්ධනයට ප්‍රධාන වශයෙන්ම විදේශ වෙළෙඳ කටයුතුවල සතුටුදායක ක්‍රියාකාරිත්වය හේතු විය. ඉහළ තෙල්මිල හා සංචාරකයන්ගේ පැමිණීමේ අඩු වීම හමුවේද, ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ දේශීය ගුවන් සේවා පියාසර කල මගී කිලෝමීටර් සංඛ්‍යාවේ සියයට 9 ක වර්ධනයත් සමග ගුවන් සේවා කටයුතු 2006 වර්ෂයේ දී තව දුරටත් වර්ධනය විය. ශ්‍රී ලංකා දුම්රිය සේවය හා පොකුරු බස් සේවා සමාගම් ධාවනය කළ මගී කිලෝමීටර් සංඛ්‍යාව වර්ෂය තුළදී පහත වැටුණි.

බැංකු, රක්ෂණ සහ වෙනත් මූල්‍ය සේවා, දේපොළ වෙළෙඳාම්, නිවාස අයිතිය, බදුදීම් සහ වෙනත් සියලු වෙළෙඳ සේවා කටයුතු ඇතුලත් වන මූල්‍ය සේවා, දේපොළ වෙළෙඳාම් සහ ව්‍යාපාරික සේවා අංශය පසුගිය වසරේ වූ සියයට 6.5 ක වර්ධනයට සාපේක්ෂව 2006 වර්ෂය තුළදී සියයට 9.7 කින් වර්ධනය විය. බැංකු අංශයේ අත්තිකාරම් වල ප්‍රසාරණය හා වෙනත් මූල්‍ය සේවා උප අංශයේ යහපත් ක්‍රියාකාරිත්වය සමඟ මූල්‍ය සේවා අංශය සියයට 10.5 ක වර්ධනයක් වාර්තා කළේය. අත්තිකාරම් මත වූ පොළී ආදායම සහ සුරැකුම්පත් මත ආයෝජනයන් ඉහළ යාමත් සමග වාණිජ බැංකුවල ආදායම සැලකිය යුතු ලෙස වර්ෂය තුළදී ඉහළ ගියේය. මේ අතර, විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතු ඉහළ යාමත් සමග වාණිජ බැංකුවල පොළී නොවන ආදායම වර්ධනය විය. ලීසිං සහ ලියාපදිංචි මුල්‍ය සමාගම්ද වර්ෂය තුළදී යහපත් වර්ධනයක් වාර්තා කළේය. දේපොළ වෙළෙඳාම් සහ සමහර ව්‍යාපාරික සේවාවන්හි ඉහළ ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස දේපොළ වෙළඳාම්, බදුදීම් සහ ව්‍යාපාරික සේවා උප අංශය සියයට 6.2 කින් වර්ධනය විය. සුපිරි මහල් නිවාස ව්‍යාපෘති වල සීඝ්‍ර වර්ධනයත් සමග දේපොළ වෙළෙඳාම් අංශය සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. දේපොළ වෙළෙඳාම් කටයුතුවල ඇති ලාභදායිත්වය හේතුකොට සමහර සමූහ ව්‍යාපාරයන්ද වර්ෂය තුලදී සුපිරි නිවාස තැනීම් කර්මාන්තයේ ආයෝජනය කර ලදී.

රාජ්‍ය පරිපලන, අනෙකුත් රාජ්‍ය සේවා හා ආරක්ෂක කටයුතු සහ අනෙකුත් ප්‍රජා, සමාජයීය හා පෞද්ගලික සේවා අංශය, පසුගිය වර්ෂයේ වූ සියයට 5.4 ක ඉහළ යාමට සාපේක්ෂව සියයට 2.8 කින් වර්ධනය විය. රාජ්‍ය සේවයට බඳවාගැනීමේ විශාල වැඩ සටහනක් වර්ෂය තුළ නොවූයෙන්, රාජ්‍ය පරිපාලන වෙනත් රාජ්‍ය සේවා සහ ආරක්ෂක උප අංශය වාර්තා කළේ සියයට 1.5 ක වර්ධනයක් පමණි. කෙසේ නමුත් මෙම වර්ධනයට යම්තාක් දුරට හේතු වූයේ ආරක්ෂක සේවාවල ප්‍රසාරණයයි. අනෙකුත් ප්‍රජා, සමාජීය සහ පෞද්ගලික සේවාවන්හි සියයට 4.8 ක වර්ධනයට පෞද්ගලික සෞඛ්‍යය සේවා, විනෝද සේවා සහ පෞද්ගලික අධ්‍යාපන සේවාවල යහපත් වර්ධනය යම්තාක් දුරට හේතු විය.

2.4 වියදම

දේශීය ආර්ථික ක්‍රියාකාරිත්වය මගින් ජනනය කරනු ලබන සමස්ත ඉල්ලුම, ආර්ථිකයෙහි පෞද්ගලික සහ රාජ්‍ය අංශයන්හි පාරිභෝජන සහ ආයෝජන වියදම්වල එකතුව වන දළ දේශීය වියදම මගින් මනිනු ලැබේ. 2005 වසරට වඩා සියයට 20.9 ක වර්ධනයක් පිලිබිඹු කරමින් පවත්නා වෙළෙඳපොළ මිල ගණන් අනුව 2006 වසරෙහි දළ දේශීය වියදම (සමස්ත දේශීය ඉල්ලුම) රුපියල් බිලියන 3,125 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. 2005 වසර සඳහා දේශීය ඉල්ලුමේ අනුරූප වර්ධනය සියයට 16.7 ක් විය. දළ දේශීය වියදමේ පුළුල් ප්‍රසාරණයට 2006 වසරෙහි පැවැති ඉහළ උද්ධමනය මෙන්ම ඉහළ ආර්ථික වර්ධනය ද හේතු විය. 2005 වසරෙහි සියයට 4.7 ක් වූ වර්ධනය හා සැසඳීමේදී, දළ දේශීය වියදම මූර්ත වශයෙන් සියයට 8.7 කින් වර්ධනය විය. 2006 වසර තුළදී පෞද්ගලික පාරිභෝජන සහ ආයෝජන වියදම් දෙකම ඉහළ නැගුණද ආර්ථිකයේ ආයෝජන ක්‍රියාකාරකම්වල ඉහළ වර්ධනය පෙන්නුම් කරමින් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පාරිභෝජන වියදමේ ප්‍රමාණය සියයට 73.8 දක්වා පහළ බැස්සේය. දළ දේශීය වියදමෙහි සහ භාණ්ඩ සහ සාධක නොවන සේවාවල ශුද්ධ ආනයනවල එකතුව වන දළ දේශීය නිෂ්පාදිතය පවත්නා වෙළෙඳපොළ මිල ගණන් අනුව රුපියල් බිලියන 2,802 ක් ලෙස ඇස්තමේන්තු කරනු ලැබීය. එය සියයට 18.4 ක වර්ධනයකි.

පරිභෝජනය

ආර්ථිකයේ පුද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයේම පාරිභෝජනයෙන් සමන්විත වන්නාවූ පාරිභෝජන වියදම 2006 වසර තුළදී රුපියල් බිලියන 2,322 දක්වා සියයට 18.6 කින් වැඩි විය. මෙය මූර්ත පාරිභෝජනය සියයට 7.2 කින් වැඩිවීමේ සහ මිල මට්ටම් සමස්ත වශයෙන් සියයට 10.7 කින් ඉහළයාමේ ප්‍රතිඵලයකි. 2005 වසරේදී සමස්ත පාරිභෝජනයෙන් සියයට 90 ක් වූ පුද්ගල පාරිභෝජන වියදම, අඩුවීමක් පෙන්නුම් කරමින් සියයට 89 ක් බවට පත්විය. නිෂ්පාදනයේ ප්‍රභවය අනුව සලකා බැලූ විට. දේශීයව නිෂ්පාදනය කළ භාණ්ඩ සහ සේවා සඳහා කළ වියදම සියයට 14.6 කින් වර්ධනය වූ අතර, ආනයනය කළ භාණ්ඩ සහ සාධක නොවන සේවා සඳහා කළ වියදම සියයට 24.8 ක ඉහළ ප්‍රමාණයකින් වැඩි විය.

ආහාර සහ මධ්‍යසාර නොවන පාන වර්ග සඳහා කරන වියදම් කොටස සම්බන්ධයෙන් මෑත වසරවලදී දක්නට ලැබුන පහළයෑමේ ප්‍රවනතාව 2006 වසර තුළදී යම් පමණකට ආපසු හැරවුනු බවක් පෙන්වමින් එම වියදම් කොටස ආන්තිකව සියයට 33.1 දක්වා වැඩිවිය. ඒ අතර, වසර තුළදී ඒ සම්බන්ධයෙන් කළ වියදම නාමික වශයෙන් සියයට 19.7 කින් ඉහළ නැගුණේය. වාර්තාගත අස්වනු ලැබීමත් සමග මිල මට්ටම් පහළ වැටීම හේතුකොට ගෙන ප්‍රධාන ආහාරය වන සහල් සඳහා වූ වියදම අඩු වුවද, මාළු, සීනි සහ කිරි නිෂ්පාදන වැනි අනෙකුත් බොහෝ ආහාර අයිතමයන් සඳහා කළ වියදම ඉහළයාමක් පෙන්නුම් කළේය. මේ අතර, සුරාබදු වැඩිකිරීම පිළිබිඹු කරමින් මධ්‍යසාර පාන, දුම්කොළ සහ මත්ද්‍රව්‍ය සඳහා කළ වියදම සියයට 11.5 ක අනුපාතයකින් වර්ධනය විය.

රෙදිපිළි සහ නිවාස සම්බන්ධිත භාණ්ඩ සහ සේවා සඳහා වන වියදම 2006 දී සියයට 7 සිට 10 දක්වා වූ පරාසයකින් වර්ධනය විය. රෙදිපිළි සහ පාවහන් සඳහා

2.11 සංඛ්‍යා සටහන — **සමස්ත ඉල්ලුම**

රුපියල් දශ ලක්ෂ

අයිතමය	පවත්නා මිල අනුව			1996 ස්ථාවර මිල අනුව		
	2004	2005 (අ)	2006(ආ)	2004	2005 (අ)	2006(ආ)
1 දේශීය ඉල්ලුම						
පරිභෝජනය	1,706,994	1,956,987	2,321,881	981,917	1,009,751	1,082,130
(% වෙනස)	15.2	14.6	18.6	5.0	2.8	7.2
දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය	506,942	627,533	803,366	294,255	326,587	370,229
(% වෙනස)	30.4	23.8	28.0	11.7	11.0	13.4
මුළු දේශීය ඉල්ලුම	**2,213,936**	**2,584,520**	**3,125,247**	**1,276,172**	**1,336,338**	**1,452,358**
(% වෙනස)	**18.4**	**16.7**	**20.9**	**6.5**	**4.7**	**8.7**
2 බාහිර ඉල්ලුම						
භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන	736,967	792,656	885,947	424,137	447,943	469,330
(% වෙනස)	16.4	7.6	11.8	7.6	5.6	4.8
භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන	921,537	1,011,583	1,209,367	617,732	636,429	689,436
(% වෙනස)	24.3	9.8	19.6	9.1	3.0	8.3
ශුද්ධ බාහිර ඉල්ලුම	-184,571	-218,927	-323,420	-193,595	-188,486	-220,106
3 මුළු ඉල්ලුම	2,029,365	2,365,593	2,801,828	1,082,577	1,147,852	1,232,252
(% වෙනස)	15.2	16.6	18.4	5.4	6.0	7.4

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

2.12 සංඛ්‍යා සටහන

පවත්නා වෙළෙඳ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදමේ සංයුතිය

	අයිතමය	මුළු පෞද්ගලික පරිභෝජන වියදමට දායකත්වය (%)			වෙනස්වීමේ අනුපාතය (%)	
		2004 (අ)	2005 (ආ)	2006 (ඇ)	05/04	06/05
1	ආහාර සහ මධ්‍යසාර නොවන පානයන්	32.6	32.5	33.1	13.9	19.7
2	මද්‍යසාර, දුම්කොළ සහ මත්ද්‍රව්‍ය	4.4	4.3	4.1	13.6	11.5
3	රෙදි පිළි සහ පාවහන්	6.0	5.8	5.3	9.2	7.5
4	නිවාස කටයුතු සහ උපයෝගිතා සේවා	16.1	15.6	14.7	10.7	10.2
5	ගෘහස්ථ උපකරණ සහ සේවා	5.0	5.0	4.7	14.6	8.7
6	සෞඛ්‍යය	3.7	3.8	3.5	16.0	10.0
7	ප්‍රවාහනය	12.1	11.9	13.5	12.1	33.3
8	සන්නිවේදනය	2.4	2.8	3.4	34.8	42.7
9	ක්‍රීඩා සහ විනෝද සේවා	3.5	3.7	3.6	22.5	11.8
10	අධ්‍යාපනය	1.6	1.6	1.5	14.7	10.3
11	ආපන ශාලා සහ හෝටල්	1.4	1.4	1.3	15.9	10.9
12	විවිධ භාණ්ඩ සහ සේවා (ඈ)	11.3	11.6	11.4	17.7	15.1
	මුළු පෞද්ගලික පරිභෝජන වියදම	**100.0**	**100.0**	**100.0**	**14.3**	**17.4**

(අ) පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණය (2003/04) පදනම් කර
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) පෞද්ගලික සේවා, පෞද්ගලික උපාංග, සමාජ ආරක්ෂණය, මූල්‍ය සේවා සහ අනෙකුත් සේවා (අන්තැනක සඳහන් නොවන) මීට ඇතුළත්වේ.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

කළ වියදම පෙර වසරට වඩා අඩු වේගයකින් වර්ධනය විය. ඉහළ විදුලි ගාස්තු සහ ඉන්ධන වියදම් සමග නිවාස උපයෝගිතා අවශ්‍යතාවන් සඳහා කළ වියදම ඉහළ ගිය අතර, ගේ දොර උපකරණ සඳහා කළ පාරිභෝගික වියදම සියයට 8.7 කින් ඉහළ ගියේය.

ප්‍රවාහන කටයුතු ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා වන පුද්ගලික වියදම නාමික වශයෙන් සියයට 33.3 කින් වර්ධනය විය. ආනයන පිළිබඳ සංඛ්‍යාවලින් සහ නව මෝටර් වාහන ලියාපදිංචි කිරීම මගින් පිළිබිඹු වූ පරිදි මෝටර් වාහන මිලදී ගැනීම් ඉහළයාම මෙම කාණ්ඩයේ වියදම ඉහළයාම උදෙසා මූලාශ්‍රය විය. තවද, බස් ගාස්තු ඉහළයාමත් ඉන්ධන මිල ගණන්වල සමස්ත වැඩිවීමත් සමග පුද්ගලික ප්‍රවාහන උපකරණ සහ ප්‍රවාහන සේවා ක්‍රියාත්මක කරවීම සඳහා වූ වියදම ඉහළ ගියේය.

සියලුම වියදම් කාණ්ඩ අතුරින්, පෙර වසරවලදී මෙන්ම සන්නිවේදන සේවා සඳහා කළ පුද්ගලික වියදම වැඩිම වේගයකින් වර්ධනය වූ පාරිභෝගික අයිතමය වශයෙන් තවදුරටත් පැවැතියේය. තාක්ෂණික වැඩිදියුණු කිරීම් සහ පහත වැටෙන ඇමතුම් ගාස්තු නිසා සේවා සපයන්නන් තමන්ගේ වෙළෙඳපොළ පරාසයන් පුළුල් කිරීමත් සමග 2006 වසර තුළදී දුරකථන සන්නිවේදන සේවා සඳහා වන පාරිභෝගික වියදම නොකඩවා වර්ධනය විය. සන්නිවේදන සේවා සඳහා වියදමේ නාමික වර්ධනය සියයට 42.7 ක් විය. මෙම කාණ්ඩය සමස්ත වියදමින් සියයට 3.4 ක ප්‍රමාණයක් නියෝජනය කරයි.

2005 වසර සමඟ සසඳීමේදී මන්දගාමී බවක් පෙන්වමින් ගතවූ වසර තුළදී සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපන සේවා ක්‍රියාකාරකම් සඳහා වූ වියදම නාමික වශයෙන් සියයට 10 කින් පමණ ඉහළ ගියේය. ජනගහනය වයස්ගතවීමත් සමග සෞඛ්‍ය වියදමේ ඉහළයාම අපේක්ෂිත සංසිද්ධියක් වන අතර, වෛද්‍යමය සහ ඖෂධ ආනයනයන්ගේ වර්ධනයේද ඒ හා සමානම ප්‍රවනතාවයක් පිළිබිඹු වන්නේය. පෞද්ගලික අංශයේ ක්‍රියාකාරී සහභාගිත්වයක් සමග අධ්‍යාපනික සේවා සඳහා වූ වියදම විශේෂයෙන්ම විවිධාංගීකරණයට ලක්විය.

ආපනශාලා හා හෝටල් සඳහා වූ වියදමත් සමගම ක්‍රීඩා සහ විනෝද ක්‍රියාකාරකම් සඳහා වූ වියදම සියයට 10 කට වැඩියෙන් වර්ධනය විය. 2005 වසරේදී වාර්තා වූ සියයට 15 කට වැඩි වර්ධන අනුපාතිකය සමඟ සැසඳීමේදී වර්ධන වේගය අඩුවීමේ ප්‍රවනතාවක් එයින් නිරූපනය වෙයි. ආරක්ෂක තත්ත්වය වර්ධනය වීම හේතුකොට ගෙන ගැටුම් පැවැති ප්‍රදේශවල දේශීය සංචාරක ක්‍රියාකාරකම් අඩුවූ නමුත්, වෙනස් වන ජීවන රටාවන් සමග පෙර වසරෙහි වර්ධනය සමග සැසඳීමේදී අඩු අනුපාතයකින් වුවද අනිකුත් විනෝද ක්‍රීඩා සහ අවන්හල් සම්බන්ධ වියදම් වර්ධනය විය.

පෙර වසර දෙක සැලකූ විට පුද්ගලික පරිභෝජන වියදම තුළ සාමාන්‍යයෙන් භාණ්ඩ සඳහා කළ වියදම් අඩුවන බවක් දක්නට ලැබුණි. එනමුත් 2006 වසරේදී, භාණ්ඩ සඳහා වන වියදම ඉහළ අනුපාතයකින් වැඩිවීමත් සමග මෙම ප්‍රවනතාවයෙන් අපගමනය වීමක් පෙන්නුම් කළේය. මෙය විශේෂයෙන්ම වසරෙහි අවසාන බාගය තුළදී මිල මට්ටම් ඉහළයාමේ බලපෑම විසින් ආංශිකව පිළිබිඹු විය.

2005 වසරෙහි සියයට 18.3 ක් වූ සාපේක්ෂ වශයෙන් අඩු වර්ධනය සමග සැසඳීමේදී 2006 වසර තුළදී රාජ්‍ය අංශයේ පරිභෝජනය නාමික වශයෙන් සියයට 29.9 කින් ඉහළ නැංගේය. රාජ්‍ය අංශයේ සේවකයන්ට ඉහළ

වැටුප් ලබාදීම නිසා රජයේ චේතන වියදම් ඉහළ යාමත් නැගෙනහිර ප්‍රදේශයේ ආරක්ෂක වාතාවරණය මෙන්ම වසර මුළුල්ලේ හටගත් ස්වභාවික විපත්තීන් සමග භාණ්ඩ හා සේවා ලබාගැනීම සඳහා ඉහළ වියදමක් දැරීමට සිදුවීමත් රජයේ පරිභෝජනය වැඩිවීමට හේතු කාරක විය. එයට අමතරව, කුටුම්භ අංශයට, පෞද්ගලික ව්‍යවසායයන්ට සහ ආයතනවලට වන පැවැරුම් සහ පොළී ගෙවීම් සඳහා වන රජයේ වියදම්ද 2006 වසර තුළදී ඉහළ නැගුණි.

ආයෝජන

පවත්නා වියදම් යටතේ වන ආයෝජන වියදම (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) රුපියල් බිලියන 803 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇති අතර, එය 2005 වසරට සාපේක්ෂව සියයට 28 ක ඉහළ යාමකි. මූර්ත වශයෙන්, එය සියයට 13.4 කින් වර්ධන වූ අතර, 2005 දී සියයට 26.5 ක් වූ ආයෝජන අනුපාතිකය (ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්) මෙම වසරේදී සියයට 28.7 දක්වා ඉහළ නැගුණි.

පැවැති දේශපාලන ස්ථාවරත්වය නිසා ඇතිවූ ව්‍යාපාරික විශ්වාසනීයත්වය ඉහළයාම හේතුවෙන් රාජ්‍ය සංස්ථාද ඇතුළත්ව ගත් කල පෞද්ගලික ආයෝජනය සියයට 31.7 කින් ඉහළ නැගුණි. මෙම වර්ධනයට හේතුවූයේ දේශීය හා බාහිරව ඇතිවූ ඉල්ලුම ඉහළයාම නිසා ධාරිතා උපයෝජනයෙහි වූ වර්ධනයයි. ආර්ථිකයෙහි ආයෝජන වියදම ඉහළයාම, නිමැවුම් කර්මාන්ත, ඉදිකිරීම් සහ විදුලි සංදේශ අංශයන්හි ආයෝජන කටයුතුවල සිදුවූ ප්‍රසාරණය තුළින් පිළිබිඹු විය. 2006 වසරේදී විදේශීය සෘජු ආයෝජන සහ ආයෝජන භාණ්ඩ ආනයනය ඉහළයාම නිසා පෞද්ගලික ආයෝජන වර්ධනය විය.

2.4 රූප සටහන **අනුමතකළ සහ ගිවිසගත් ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන්හි ආයෝජන**

ව්‍යාපෘති සංඛ්‍යාව



ආයෝජන වටිනාකම



මෑත කාලයේ ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළ විදේශ ආයෝජන ලැබීම් 2006 වසරේ දී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 604 ක් දක්වා සියයට 110.3 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනය ළඟා කරගෙන ඇත්තේ ආයෝජන මණ්ඩලය මගින් වරණීය බදු සහන සැලසීම හා ආයෝජන ගිවිසුම් මත ඇති ව්‍යවස්ථාපිත බැඳීම්වල ප්‍රතිඵලයක් වශයෙනි. ආයෝජන මණ්ඩලය මගින් 2006 දී විදේශ ආයෝජන වැඩිකිරීමේ අපේක්ෂාවෙන්, ව්‍යාපාරික ප්‍රජාව සමග එක්ව ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙවරෙහි යෙදීම සහ ප්‍රදර්ශණ පැවැත්වීම වැනි ආයෝජන ප්‍රවර්ධන ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කළේය. 2006 සමස්ත ආයෝජනවලින් සියයට 60 කට වඩා ආයෝජනය කර ඇත්තේ විදුලි සංදේශ සහ රෙදිපිළි, ඇඟළුම් හා සම් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයන්හිය. ආයෝජන මණ්ඩල පනතේ 17 හා 16 වන වගන්ති යටතේ ආයෝජන වටිනාකම රුපියල් බිලියන 3,991.6 ක් වූ ව්‍යාපෘතීන් 354 ක් 2006 දී අනුමත කර ඇත. 2005 දී අනුමත කළ ව්‍යාපෘති 374 ක වටිනාකම රුපියල් බිලියන 79.5 කි. 2006 වසරේ දී, ගුවන් සේවා අංශයේ මහා පරිමාණ ආයෝජනයක් සිදු කර ඇත. ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන් තුළ දැනටමත් සිදුකර ඇති ආයෝජනවල සමුච්චිත වටිනාකම 2006 දී රුපියල් බිලියන 468 ක් වූ අතර, එය 2005 දී පැවැති රුපියල් බිලියන 380 ට වඩා සියයට 23.2 ක වැඩිවීමකි.

2006 දී 17 වන හා 16 වන වගන්ති යටතේ අනුමත කළ මෙම ව්‍යාපෘතීන් 354 න් 82 ක් පූර්ණ විදේශ හිමිකාරිත්වයෙන් ද ව්‍යාපෘතීන් 87 ක් ශ්‍රී ලාංකීය හා විදේශීය ආයෝජකයින්ගේ හවුල් ව්‍යාපාර ද වූ අතර ඉතිරි ව්‍යාපෘතීන්හි අයිතිය සම්පූර්ණයෙන්ම ශ්‍රී ලාංකිකයින් සතු විය. ආයෝජන ප්‍රවාහ ලැබීමේ දී මූලිකත්වය ගනු ලැබූ සේවා අංශය අනුමත කළ ව්‍යාපෘති 222 ක් සඳහා රුපියල් බිලියන 3,942.5 ක ආයෝජනය සඳහා ගිවිස ගත්තේය. එම ආයෝජනයන් භාණ්ඩ ප්‍රවාහන හා ගුවන් සේවා, විදුලි සංදේශ, නිවාස දේපොළ සංවර්ධනය හා කාර්යාල සංකීර්ණ, හෝටල් සහ ආපනශාලා, බලශක්ති උත්පාදනය, තොරතුරු තාක්ෂණය හා බාහිර පාර්ශවයන් මගින් සේවා ඉටුකරගැනීම යන අංශයන් විසින් අවශෝෂණය කර ගත්තේය. කාර්මික අංශය තුළ වැඩිම ආයෝජන ප්‍රමාණයක් අවශෝෂණය කරගත් අංශ වූයේ රෙදිපිළි, ඇඟළුම් හා සම් භාණ්ඩ නිෂ්පාදිත, ආහාරපාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත, රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත සහ ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිතයන්ය.

2.13 සංඛ්‍යා සටහන

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායයන්හි ආයෝජන සහ සේවා නියුක්තිය

රුපියල් දශ ලක්ෂ

කාණ්ඩය	ව්‍යාපෘති සංඛ්‍යාව		ආයෝජන (රු. දශ ලක්ෂ)						සේවා නියුක්තිය	
	2005(අ)	2006(ආ)	2005(අ)			2006(ආ)			2005(අ)	2006(ආ)
			විදේශීය	දේශීය	එකතුව	විදේශීය	දේශීය	එකතුව		
ආයෝජන මණ්ඩලය										
අනුමත කළ ව්‍යාපෘති	374	354	31,511	47,961	79,473	229,363	3,751,113	3,991,576	35,971	80,107
17 වන වගන්තිය යටතේ	222	303	27,767	46,863	74,631	220,756	3,749,880	3,970,636	29,367	65,292
16 වන වගන්තිය යටතේ	152	51	3,744	1,098	4,842	8,607	1,233	20,940	6,604	14,815
17 වන වගන්තිය යටතේ ගිවිසගත් ව්‍යාපෘති	167	217	32,363	45,562	74,925	38,756	3,699,328	3,738,085	24,536	41,559
17 වන වගන්තිය යටතේ දැනට කර ඇති ආයෝජන	1,871	1,929	233,523	146,606	380,129	285,367	182,650	468,016	410,851	420,690
වාණිජ කටයුතුවල නිරත වූ (අ)	2,463	2,456	183,186	164,205	347,391	183,202	170,669	353,871	395,201	379,945
17 වන වගන්තිය යටතේ (අ) (අ)	1,642	1,615	166,596	153,267	319,863	166,278	159,711	325,989	357,681	341,909
16 වන වගන්තිය යටතේ (අ)	821	841	16,590	10,938	27,528	16,924	10,958	27,882	37,520	38,036
කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය										
ලියාපදිංචි වූ ව්‍යාපෘති (අ)	1,641	1,629	ලැ.නො.	ලැ.නො.	118,502	ලැ.නො.	ලැ.නො.	119,344	282,036	273,553

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(අ) වර්ෂය අවසානයේ සමුච්චිත අගය
(අ) ප්‍රසාරණය කළ ව්‍යාපෘතීන් ද ඇතුළත්ව

මූලයන් : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ 2005 දී ගිවිසගත් ව්‍යාපෘතීන් 167 හා සසඳන විට 2006 දී එය 217 දක්වා වැඩි විය. 2006 දී ගිවිසගත් ආයෝජනවලින් සියයට 99 ක් සඳහා සේවා අංශය දායක විය. ගුවන් සේවා හා භාණ්ඩ ප්‍රවාහන, දේපොළ වෙළෙඳාම, බලශක්ති උත්පාදනය, වරාය හා මහාමාර්ග සහ සන්නිවේදන අංශයන් සේවා අංශයේ ආයෝජන වැඩි ප්‍රමාණයක් අවශෝෂණය කරගත් අතර, කම්හල් කර්මාන්ත අංශය තුළ වැඩි ආයෝජන ප්‍රමාණයක් යොදවා තිබෙනුයේ රෙදිපිළි, ඇඟලුම් හා සම් භාණ්ඩ නිෂ්පාදිත, ආහාර, පානවර්ග හා දුම්කොළ නිෂ්පාදිත සහ රසායනික ද්‍රව්‍ය, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිතයන් යනාදී අංශයන් සඳහාය.

2006 දී වාණිජ කටයුතු අරම්භ කළ ව්‍යාපෘතීන් ගණන 2,375 ක් වූ අතර 2005 දී එය 2,385 ක් විය. මෙම ව්‍යාපෘතීන්ගෙන් සියයට 50 ක් පමණ සමන්විත වන්නේ රෙදිපිළි, ඇඟලුම් හා සම් භාණ්ඩ නිෂ්පාදිත, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත සහ ලෝහමය නොවන බනිජ නිෂ්පාදිතයන් වලිනි. 2006 වසරේ ඉතිරි ව්‍යාපෘතීන් සේවා සහ කෘෂිකාර්මික අංශයන් විසින් අවශෝෂණය කර ගැනිණි.

2006 තුළ ව්‍යවසායයන් 1,629 ක් කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇත. ලියාපදිංචි සම්පූර්ණ ව්‍යවසායයන් අතුරින් වැඩිම ප්‍රමාණයක් රෙදිපිළි, ඇඟලුම් හා සම් භාණ්ඩ නිෂ්පාදිත කාණ්ඩය (405) යටතේ ලියාපදිංචි වී ඇති අතර ඊට පසුව රසායනික ද්‍රව්‍ය, රබර්, ප්ලාස්ටික් සහ බනිජ තෙල් නිෂ්පාදිත (380), සකස් කළ ලෝහ නිෂ්පාදිත (268), ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත (197) හා ලෝහමය නොවන බනිජ නිෂ්පාදිත (84) වශයෙන් ලියාපදිංචි වී ඇත. මෙම ආයෝජනවල අගයෙන් සියයට 94 ක් නියෝජනය කරමින් ව්‍යාපාර සංඛ්‍යාවෙන් සියයට 83 ක් කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක තුළ ස්ථානගත වී ඇත.

අඛණ්ඩව වර්ධනය වූ රාජ්‍ය ආයෝජන වියදම රුපියල් බිලියන 108 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත. රාජ්‍ය ආයෝජන ප්‍රධාන වශයෙන් යොමුව ඇත්තේ ආර්ථික සහ සමාජ සංවර්ධනය උදෙසාය. යටිතල පහසුකම් සංවර්ධනය විම, දේශීය හා විදේශීය ආයෝජනයන් ආකර්ශනය කරගැනීම හේතු වනු ඇත. 2006 වර්ෂයේදී රජය, මහා මාර්ග සහ අධිවේගී මාර්ග, දුම්රිය මාර්ග

2.14 සංඛ්‍යා සටහන

සම්පත් සංයුතිය සහ උපයෝජනය (1996 ස්ථාවර මිල අනුව)

අයිතමය	ප්‍රතිශතාත්මක දායකත්වය		ප්‍රතිශතාත්මක වර්ධනය	
	2005(අ)	2006(ආ)	2005(අ)	2006(ආ)
1. සම්පත්				
වෙළෙඳ මිල අනුව ද.දේ.නි.	64.3	64.1	6.0	7.4
භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන	35.7	35.9	3.0	8.3
එකතුව	**100.0**	**100.0**	**4.9**	**7.7**
2. උපයෝජනය				
පරිභෝජනය	56.6	56.3	2.8	7.2
දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය	18.3	19.3	11.0	13.4
පෞද්ගලික අංශය	14.7	16.1	-0.2	17.8
රජය	3.6	3.2	105.7	-5.0
තොග වෙනස්වීම්	0.0	0.0	23.4	5.2
භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන	25.1	24.4	5.6	4.8
එකතුව	**100.0**	**100.0**	**4.9**	**7.7**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

2.5 රූප සටහන **2006 වර්ෂයේ ආර්ථිකය (පවත්නා මිල යටතේ)**

භාණ්ඩ සහ සේවා සැපයුම
(රුපියල් බිලියන 4,011)



භාණ්ඩ සහ සේවා සඳහා ඉල්ලුම
(රුපියල් බිලියන 4,011)



හා ප්‍රවාහනය, දුරකථන සංනිවේදනය, වරාය සහ ගුවන් තොටුපොළ, ගල්අඟුරු බලාගාරය සහ ජල විදුලිය, වාරිමාර්ග සහ ජල සැපයුම් යන අංශයන්හි ආයෝජන කටයුතු පිළිබඳ උනන්දු විය. මේ අතර, රටෙහි සමාජ ප්‍රමිතීන් පවත්වාගැනීමේ අරමුණින් යුතුව රාජ්‍ය ආයෝජන අධ්‍යාපන හා සෞඛ්‍යය සංවර්ධනය කෙරෙහි ද අවධානය යොමු විය.

පවත්නා සම්පත් සහ උපයෝජනය

දළ දේශීය නිෂ්පාදිතය (දේශීය සම්පත්) සහ භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන (විදේශීය සම්පත්) වලින් සමන්විත රටෙහි සමස්ත සම්පත් ප්‍රමාණය වෙළෙඳපොළ මිල යටතේ රුපියල් බිලියන 4,011 ක් වශයෙන් ඇස්තමේන්තු කොට ඇත. මෙය 2005 වර්ෂයට සාපේක්ෂව සියයට 18.8 ක එනම් රුපියල් බිලියන 634 ක වැඩිවීමකි. මෙයින් දේශීය සම්පත් රුපියල් බිලියන 436 කින්ද, විදේශ සම්පත් රුපියල් බිලියන 198 කින්ද වැඩි විය. 2005 වර්ෂයේදී මූර්ත වශයෙන් සියයට 3 ක් වූ විදේශ සම්පත් වර්ධනය, 2006 දී සියයට 8.3 කින් වර්ධනය වූ අතර, සමස්ත සම්පත් ප්‍රමාණය 2006 දී සියයට 7.7 කින් (2005 දී සියයට 4.9 කි) ඉහළ ගියේය. පෙර වර්ෂයේදී මෙන්ම මුළු සම්පත් උපයෝජනයෙන් සියයට 64 ක් දේශීය සම්පත්වලින් සමන්විත වූ අතර, ඉතිරි සියයට 36 විදේශ සම්පත්වලින් සමන්විත විය. එසේ වුවද, මුළු සම්පත් සංයුතියෙහි විදේශ දායකත්වයේ සුළු වැඩිවීමක් දැක්විය හැකි විය.

සම්පත් උපයෝජනයට ප්‍රධාන වශයෙන් පරිභෝජනය, ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සහ භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන අඩංගු වේ. 2006 දී මූර්ත වශයෙන්, පරිභෝජනය සියයට 7.2 කින් වර්ධනය (2005 දී සියයට 2.8 කි) වෙමින්, සම්පත්වලින් සියයට 56 ක් අවශෝෂණය කළ අතර, ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 13.4 ක (2005 දී සියයට 11 කි) වර්ධනයක් සහිතව සියයට 19 ක සම්පත් අවශෝෂණය

2.15 සංඛ්‍යා සටහන **පරිභෝජනය, ආයෝජන සහ ඉතිරිකිරීම් (පවත්නා වෙළෙඳ මිල අනුව)**

අයිතමය	රුපියල් මිලියන		ප්‍රතිශතක වෙනස		ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස	
	2005 (අ)	2006 (ආ)	2005 (අ)	2006 (ආ)	2005 (අ)	2006 (ආ)
1. වෙළෙඳ මිල අනුව ද.දේ.නි.	2,365,593	2,801,828	16.6	18.4	100.0	100.0
2. පරිභෝජන වියදම	1,956,987	2,321,881	14.6	18.6	82.7	82.9
පෞද්ගලික	1,761,894	2,068,512	14.3	17.4	74.5	73.8
රජය	195,093	253,369	18.3	29.9	8.2	9.0
3. ආයෝජන	627,533	803,366	23.8	28.0	26.5	28.7
පෞද්ගලික	528,202	695,609	14.4	31.7	22.3	24.8
රජය	99,331	107,757	119.5	8.5	4.2	3.8
4. දේශීය ඉතුරුම්	408,606	479,947	26.8	17.5	17.3	17.1
පෞද්ගලික	472,210	550,073	17.9	16.5	20.0	19.6
රජය	-63,604	-70,126	18.7	-10.3	-2.7	-2.5
5. දේශීය ඉතිරුම්-ආයෝජන පරතරය	-218,927	-323,420	-18.6	-47.7	-9.3	-11.5
6. විදේශීය ශුද්ධ සාධක ආදායම	-30,049	-40,752	-45.3	-35.6	-1.3	-1.5
7. විදේශීය ශුද්ධ පෞද්ගලික සංක්‍රාම	174,426	215,093	27.7	23.3	7.4	7.7
8. ජාතික ඉතුරුම්	552,983	654,287	26.2	18.3	23.4	23.4

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

කළේය. භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන සියයට 4.8 කින් වර්ධනය වූ අතර, එහි සාපේක්ෂ දායකත්වය 2005 ට වඩා අඩු වර්ධන අනුපාතයක් පිළිබිඹු කරමින් සියයට 24.4 දක්වා ආන්තිකව පහළ වැටුණි.

පවත්නා මිල ගණන් යටතේ භාණ්ඩ හා සේවාවන්හි සමස්ත සැපයුමෙන්, දේශීය ආර්ථික ක්‍රියාකාරකම්වල දායකත්වය සියයට 66 ක් වූ අතර, ඉතිරිය ආනයනය කෙරුණි. දේශීය සේවා සැපයුමෙහි, පසුගිය වසරේ වූ සියයට 38 ක දායකත්වය 2006 වසරේදී නොවෙනස්ව පැවැතුණු අතර, කර්මාන්ත නිෂ්පාදන හා කෘෂිකර්මාන්ත උප අංශයන්හි දායකත්වය සියයට 1 බැගින් පහත වැටුණු දේශීය භාණ්ඩ සැපයුමේ දායකත්වය සියයට 30 සිට සියයට 28 දක්වා පහත වැටුණි. ඊට ප්‍රතිවිරුද්ධ ලෙස ආනයනික භාණ්ඩ සැපයුම සියයට 28 සිට සියයට 30 දක්වා වැඩිවූ අතර, සේවා ආනයන සියයට 4ක් ලෙස නොවෙනස්ව පැවැතිණි.

නාමිකව භාණ්ඩ හා සේවාවන් සඳහා සමස්ත ඉල්ලුමෙන්, පරිභෝජනය සහ ප්‍රාග්ධන සම්පාදනයේ දායකත්වය පිළිවෙලින් සියයට 58 සහ සියයට 20 දක්වා ආන්තිකව වර්ධනය වූ අතර, පසුගිය වසරට සාපේක්ෂව භාණ්ඩ හා සේවා අපනයන ආන්තිකව සියයට 22 දක්වා අඩු විය. සමස්ත දේශීය ඉල්ලුමෙන් පෞද්ගලික අංශයේ ආයෝජන සියයට 87 ක (2005 දී සියයට 84 ක) දායකත්වයක් දැක්වූ අතර, රාජ්‍ය පරිභෝජනයන්හි ඉහළ ප්‍රසාරණය හේතුකොටගෙන පෞද්ගලික අංශයේ පරිභෝජනය සියයට 89 ක (2005 දී සියයට 90 ක) දායකත්වයක් දැක්වීය.

ඉතුරුම්

2006 වර්ෂය තුළදී දේශීය හා ජාතික ඉතුරුම් ඉහළ අනුපාතිකයකින් වර්ධනය වුවද, දළ දේශීය නිෂ්පාදිතයද ඉහළ අගයකින් වර්ධනය වූ බැවින්, ඉතුරුම් ද.දේ.නි. හි අනුපාතයක් ලෙස ආන්තිකව පහත වැටුණි. සම්පත් පරතරය එනම් දේශීය ඉතුරුම් සහ ආයෝජනය අතර වෙනස, ද.දේ.නි. හි අනුපාතයක් ලෙස සියයට 9.3 සිට සියයට 11.5 දක්වා ඉහළ ගිය අතර, ආයෝජන අනුපාතය, දේශීය ඉතුරුම් අනුපාතයට වඩා වැඩි වේගයකින් වර්ධනය විය.

පෞද්ගලික ඉතුරුම් සහ රාජ්‍ය ඉතුරුම්වලින් සමන්විත දේශීය ඉතුරුම් රුපියල් බිලියන 480 දක්වා සියයට 17.5 කින් වර්ධනය විය. ආයතනික අංශයේ ඉතුරුම් සහ පුද්ගලික ඉතුරුම් ඉහළයාමත් සමග පෞද්ගලික අංශයේ ඉතුරුම් සියයට 16.5 කින් ඉහළ ගියේය. මේ අතර, රාජ්‍ය අයවැයෙහි ජංගම ගිණුම් ශේෂය වන රාජ්‍ය ඉතුරුම් සෘණ අගයක් ගත් නමුත්, ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස 2005 ට සාපේක්ෂව සියයට 2.5 ක් ලෙස වර්ධනය විය.

දේශීය ඉතුරුම්, විදේශීය ශුද්ධ සාධක ආදායම සහ විදේශීය ශුද්ධ පෞද්ගලික සංක්‍රාමවල එකතුව වන, ජාතික ඉතුරුම් රුපියල් බිලියන 654 දක්වා සියයට 18.3 කින් ඉහළ ගියේය. ණය පොලී ගෙවීම් ඉහළයාමත් සමඟම විදේශීය ශුද්ධ සාධක ආදායම තවදුරටත් සෘණ අගයක පවතිමින් සහ වඩා වැඩි වේගයකින් බිලියන 41 දක්වා පිරිහීමට ලක් විය. විදේශ රැකියාවල නියුතු වූවන්ගේ ශුද්ධ පෞද්ගලික සංක්‍රාම රුපියල් බිලියන 215 දක්වා සියයට 23 කින් ඉහළ ගියේය.